
# මතෙව් බයිබල් පාඩම

රෝස් ඒ ගුඩ්මන් විසිනි



"පළමුව දෙවියන්වහන්සේගේ රාජ්‍යයද, උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමද සොයන්න. එවිට මේ සියල්ලම ඔබට දෙනු ලැබේ."

—මතෙව් 6 : 33.

# සංඥාපනය

යහපත් සුභාරංචි කථාන්තරය ලිහිල් ප්‍රකාශයකින් ලබාගැනීම පිණිස සැලකිලිමත් වන සැමදෙන සඳහා මෙම මතෙව් පාඨම සකස් කර ඇත. ලෝ පැවසීමට මීට වඩා උසස් පණිවුඩයක් තවත් නැත!

ලෝ පැතිර සිටින සියලු මිනිසාට දෙවියන්වහන්සේගේ ලියන ලද වචනය පහසුවෙන් වටහාගැනීම පිණිසද, පාපය අත්හැර යේසුස් ක්‍රිස්තුස් වහන්සේව සිය පුද්ගලික ගැලවුම්කරු සේ සොයාගැනීම පිණිසද, මෙම කුඩා පොත ඔබට පිහිටවනු ඇතැයි අපි බලාපොරොත්තු වෙමු. අපට සදකාල ජීවනය දීමට පැමිණි ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට කැප වූ, ඉතා ලස්සන ප්‍රසන්න ක්‍රිස්තියානි ජීවිතයක් දිනපතා ගෙන යාමට මෙය කියවන ඔබ සැමට දේව අනුග්‍රහය ලැබෙත්වා!

---

කර්තෘ: රෝස් ඒ. ගුඩ්මන්

---

# අප ගැලවුම්කරු යේසුස් ක්‍රිස්තුස්ගේ උපත



(මතෙව් 1 : 18-25)

යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ උත්පත්තිය මෙසේය: උන්වහන්සේගේ මව මරියා යෝසප්ට සරණපාවා දීමට සිටි කළ, ඔවුන් එක්වීමට පෙර, ශුද්ධාත්මයාණන් තුළින් ඈ ගැබ්ගෙන සිටීය. ධර්මිෂ්ඨයකු වන ඇගේ පුරුෂයා යෝසප්, ඇයට නින්ද කිරීමට අකැමතිව රහසින් ඇයව අත්හැරීමට සිතුවේය. ඔහු මෙම කාරණා කල්පනා කරමින් සිටනාතර බලව, ස්වාමින්වහන්සේගේ දූතයෙක් ඔහුට සිහිනයකින් පෙනී: දවිත්ගේ පුත්‍ර යෝසප්, ඔබේ බිරිඳ, මරියා විවහා කරගැනීමට භය නොවන්න. මක්නිසාද, ඇය තුළ පිළිසිඳ වූ යමක් ඇද්ද, එය ශුද්ධාත්මයාණන් තුළින්ය. ඇය පුතෙක් ප්‍රසූත කරයි; උන්වහන්සේට ''යේසුස්'' යන නම තබන්න. මක්නිසාද තම සෙනඟ ඔවුන්ගේ පාපයෙන් ගලවන්නේ උන්වහන්සේ යයි කීය. මෙ සියල්ල සිදුවූයේ: බලව, කන්‍යාව ගැබ්ගෙන පුතෙකු ප්‍රසූත කරන්නීය; එතුමාට එම්මානුවෙල් යන නම තබනවා ඇත කියා ස්වාමින්වහන්සේ අනාගතවක්තෘ තුළින් ප්‍රකාශ කළ දැ සම්පූර්ණ වන පිණිසය. ඒ නාමයේ අර්ථය: ''දෙවියන්වහන්සේ අප සමගය'' යනුයි. එවිට යෝසප් නින්දෙන් අවදිව, ස්වාමින්වහන්සේගේ දූතයා ඔහුට අණ කළ ලෙස තම බිරිඳ විවහාකර ගත්තේය. නමුත් ඇය කුළුඳුල් පුතු බිහි කරන තුරු, ඔහු ඇයව නැඳින්නේය. ඔහු එතුමාට ''යේසුස්'' යන නම තැබීය.

## ඔබ කළ යුතු දෙය

අ. හිස්තැන් පුරවන්න. සෑම පිළිතුරක්ම මෙම කථාන්තරයේම ඇත.

1. යේසුස්වහන්සේගේ මවගේ නම කුමක්ද? ..............................

2. යේසුස්වහන්සේ .................... තුළින් පිළිසිඳ වී සිටිසේක.

ශුද්ධාත්මයාණන්වහන්සේ හා දෙවියන්වහන්සේ එක්කෙනෙකු බැවින් යේසුස්වහන්සේගේ පියාණන් දෙවියන්වහන්සේ බව, එය අපට පෙන්වයි. ''සාක්ෂි දරන තිදෙනෙක් ස්වර්ගයෙහි ඇත. ඔවුහු නම්, පියාණන් පුත්‍රයාණන් හා ශුද්ධාත්මයාණන්ය. ඔවුන් තිදෙනාම එක්කෙනෙකි.''
— 1 යොහන් 5 : 8

3. යෝසප්ට සිහිනයකින් මෙසේ කීවේ කවුද ? ''ඔබේ බිරිඳ මරියා විවහා කරගැනීමට භය නොවන්න. මක්නිසාද ඇය තුළ පිළිසිඳ වූ යමක් ඇද්ද, එය ශුද්ධාත්මයාණන් තුළින්ය''.....................

4. ''එ'' අකුරෙන් පටන්ගන්නා තව නමක් යේසුස්වහන්සේට දී ඇත.


එය කුමක්ද? ......................................................

5. එම්මානුවෙල් යන නාමයේ අර්ථය කුමක් ද?............................
(වචන තුනකි)
........................ ..........................

ආ. මෙම පදය ඉගෙනගන්න—

''උන්වහන්සේට යේසුස් යන නම තබන්න ; මක්නිසාද තම සෙනඟ ඔවුන්ගේ පාපයෙන් ගළවන්නේ උන්වහන්සේය''—මතෙව් 1:21

# යේසුට අප පාපයෙන් අපව ගැලවීමට හැකි ඇයි




යේසුස්වහන්සේගේ පියාණන් ශුද්ධාත්මයාණන් බැවින් උන්වහන්සේට මනුෂ්‍ය පියෙක් නොසිටීහ. මෙනිසා උන්වහන්සේගේ ලෙය දිව්‍යමයය එමෙන්ම අප පව් උදෙසා උන්වහන්සේට කුරුසිය මත දිවි පිදීමටද හැකි වූහ. යේසුස්වහන්සේ තුළ කිසිදු පාපයක් නැති හෙයින් උන්වහන්සේ පාපය වෙනුවෙන් සිටි එකම සම්පූර්ණ නිර්මල පූජාවයය. යේසුස් වහන්සේ පිරිසිදුය, නිර්මලය, ධර්මිෂ්ඨය. උන්වහන්සේගේ විශේෂ ලෝ පැමිණීම අපව පාපයෙන් ගැලවීමට නිසා අපි උන්වහන්සේට ගැළවුම්කරු යයි කියමු. අපව ගළවන පිණිස උන්වහන්සේ ආසේක.

## යේසුස්වහන්සේ දෙවියන්වහන්සේය—
## උන්වහන්සේ මනුෂ්‍යාකාරයෙන් ආසේක

# 2. ශාස්ත්‍රවන්තයින් යේසුස්වහන්සේව බැහැදකියි




(මතෙව් දෙවන පරිච්ඡේදය)

තවද, හෙරෝද් රජ දවස යුදයේ බෙත්ලෙහෙම්හි යේසුස්වහන්සේ උපන් කළ, පූර්ව දිසාවෙන් ශාස්ත්‍රවන්තයෝ යෙරුසලමට පැමිණ: යුදෙව්වරුන්ට රජව උපන් තැනැන්වහන්සේ කොතැන්හි ද? මක්නිසාද අපි උන්වහන්සේගේ තාරකාව පූර්ව දිසාවෙහි දැක උන්වහන්සේට නමස්කාර කිරීමට ආවෙමු යයි කීහ. හෙරෝද් රජ එය ඇසූ කළ, ඔහුද, මුලු යෙරුසලමද, කැළඹුණාහ. එකල ඔහු සියලු නායක පූජකයන්ද සෙනඟගේ ලියන්නන්ද රැස්කර, ක්‍රිස්තුස්වහන්සේ කොතැන උපදීද යත් ඔවුන්ගෙන් විචාළේය. ඔවුහු කථාකර: යුදයේ බෙත්ලෙහෙම්හිය. කුමක්හෙයින්ද-එම්බා බෙත්ලෙහෙම යුද දේශය, නුඹ යුදගේ අධිපතීන් අතරෙහි කොයි ලෙසකින්වත් ඉතා කුඩා නොවන්නේය. මක්නිසාද මාගේ ඉශ්‍රායෙල් සෙනඟ පාලනය කිරීමට ආණ්ඩුකාරයෙක් නුඹ කෙරෙන් නික්මෙන්නේය කියා අනාගතවක්තෘ විසින් ලියා තිබේ යයි ඔහුට කීවෝය. එකල හෙරෝද් ශාස්ත්‍රවන්තයින් රහසින් කැඳවා, තාරකාව කුමන කල දුටුවේදැයි නිසියාකාර ඔවුන්ගෙන් දැන: නුඹලා ගොස් ඒ ළදරුවා ගැන නිසි ලෙස විභාග කරන්න. නුඹලාට සම්භවූ විට, මමද ගොස් උන්වහන්සේට නමස්කාර කරන පිණිස මට දන්වන්න කියා ඔවුන් බෙත්ලෙහෙමට යැවීය. ඔවුහු රජුගේ බස් අසා පිටත් වූහ. බලව, පූර්ව දිසාවෙහි ඔවුන් දුටු තාරකාව ළදරුවා සිටි තැන මුදුනට පැමිණ නවතින තුරු ඔවුන්ට පෙරටුව ගියේය.



ඔවුහු තාරකාව දැක අති මහත් ප්‍රීතියකින් ප්‍රීති වූහ. ඔවුහු ගෙට වැද ළදරුවා ස්වකීය මව, මරියා සමග සිටිනවා දැක, බිම වැටී උන්වහන්සේට නමස්කාර කර, තම කරඬු ඇර, රන්ද, කට්ටකුමංජල්ද, සුවඳලාටුද යන පඬුරු උන්වහන්සේට පිදූහ. තවද හෙරෝද් වෙත නැවත නොයන ලෙස දෙවියන් වහන්සේ ඔවුනට සිහිනයකින් දැන් වූ නිසා ඔවුහු වෙන මගකින් තම රටට ගියෝය. ඔවුන් ගිය පසු ස්වාමින් වහන්සේගේ දූතයෙක් සිහිනයකින් යෝසප්ට පෙනී : නැගිට ළදරුවාද උන්වහන්සේගේ මෑණියන්ද රැගෙන මිසරයට පලා ගොස් මා ඔබට කියන තුරු එහි සිටින්න. මක්නිසාද හෙරෝද් ළදරුවා විනාශ කිරීමට සොයනවා ඇතැයි කීවේය. ඔහු නැගිට, රාත්‍රියෙහි, ළදරුවාද, උන්වහන්සේගේ මෑණියන්ද රැගෙන මිසරයට ගොස් හෙරෝද්ගේ මරණය දක්වා එහි සිටියේය. මෙසේ වූයේ: මිසරයෙන් මාගේ පුත්‍රයා කැඳවා ගනිමියි කියා ස්වාමින්වහන්සේ අනාගතවක්තෘ තුළින් කී දෙය සම්පූර්ණ වන පිණිසය. එකල හෙරෝද් ශාස්ත්‍රවන්තයින් තමා රැවටූ බව දැන, ඉතා උදහස්ව ඔවුන්ගෙන් දැනගත් නිසිකල හැටියට මනුෂ්‍යයන් යවා බෙත්ලෙහෙම්හිද එහි සියලු සීමාවලද සිටි දෑ අවුරුදු වයස් වූ හා ඊට බාල වූ සියලු පිරිමි දරුවන් මැරුවේය. එකල : හැඬීමේ හා බොහෝ වැලපීමේ හඬක් රාමාහි ඇසුණේය ; රේචල් ඇගේ දරුවන් ගැන අඬමින් ඔවුන් නැති නිසා සැනසෙන්නට අකැමති විය කියා අනාගතවක්තෘ යෙරෙමියා තුළින් කියන ලද කාරණාව සම්පූර්ණ විය. නමුත්, හෙරෝද් නැසීගිය පසු, බලව, ස්වාමින්වහන්සේගේ දූතයෙක් සිහිනයකින් යෝසප්ට පෙනී: නැගිට ළදරුවා ද, උන්වහන්සේගේ මෑණියන්ද රැගෙන ඉශ්‍රායෙල් දේශයට යන්න. මක්නිසාද ළදරුවාගේ ජීවිතය නසන්ට සෙවූ අය මළෝ යයි කීවේය. එවිට ඔහු නැගිට ළදරුවාද, උන්වහන්සේගේ මෑණියන්ද රැගෙන ඉශ්‍රායෙල් දේසයට ආවේය.



එහෙත් අර්කෙලාවුස්, තම පියා හෙරෝද් වෙනුවට යුදයේ රජකම් කරන බව අසා එහි යෑමට බියව, දෙවියන්වහන්සේ සිහිනයකින් දැන්වූ ලෙස ගලීලයේ පළාත්වලට ගොස්, නාසරෙත් නම් නුවරට පැමිණ එහි වාසය කළේය. මෙසේ වූයේ උන්වහන්සේ නාසරීයෙක් යයි කියනු ලබන්නේ යයි අනාගතවක්තෘ තුළින් කියන ලද කාරණාව සම්පූර්ණ වන පිණිසය.

## ඔබ කළ යුතු දෙය

අ. පහත සඳහන් ප්‍රශ්නවලට ''ඔව'' හෝ ''නැත'' කියා පිළිතුරු සපයන්න.

1. යේසුස්වහන්සේ ඉපදුණේ යුදයෙහි බෙත්ලෙහෙමෙහිද?...............
2. ශාස්ත්‍රවන්තයින් තාරකාව දුටුවේ පූර්ව දිසාවෙහිද? ....................
3. යේසුස්වහන්සේ ඉපදුණ බව ඇසීමෙන් හෙරෝද් රජ සතුටු වීද?......
4. ශාස්ත්‍රවන්තයින් නැවත ගොස්, ළදරු යේසුස්වහන්සේ සිටින ස්ථානය හෙරෝද් රජුට දැන්වූවාද?....................
5. යෝසප්ට මිසරයට පලායන ලෙස ස්වාමින්වහන්සේගේ දූතයා කීවාද ?............
6. බෙත්ලෙහෙමෙහිද එහි සියලු සීමාවලද සිටි දෑ අවුරුදු වයස් හා ඊට බාල කුඩා ළමුන් හෙරෝද් රජ විසින් මරා දමනු ලැබුවාද?......
7. එක් කලෙක නාසරෙත් යන නගරයේ යේසුස්වහන්සේ ජීවත්වීද......


ආ. මෙම වාක්‍යයේ හිස්තැන් එම කථාන්තරයේ ඇති එම වචනවලින් පුරවන්න.

''ඔවුහු ගෙට වැද, ළදරුවා ස්වකීය මව..............සමග සිටිනවා දැක බිම වැටී,..................නමස්කාර කර, තම කරඩු ඇර ..............ද, කට්ටකුමංජල් ද..................... ද යන පඬුරු උන්වහන්සේට පිදූහ.

# පළමු ත්‍යාගය

යේසුස්වහන්සේට ශාස්ත්‍රවන්තයින් විසින් පළමු ත්‍යාගය ගෙනෙන ලදහ. රන් පිදීම උන්වහන්සේගේ රාජමහිමය හෝ රාජත්වය ගැන සඳහන් කරයි. කට්ටකුමංජල් හා සුවඳලාටු ආසියාවේ වැවෙන ගස්වලින් ලබාගන්නා ඉතා සුවඳ ද්‍රව්‍යයන්ය. රන් මෙන්ම මෙයද, මිනිසාට ඉතා අගනේය. උන්වහන්සේ මාංසාකාරව ඉපදී මරුමුවට පත්වන බැවින් සුවඳලාටු උන්වහන්සේගේ මනුෂ්‍යත්වය පෙන්නුම් කරයි. කට්ටකුමංජල් උන්වහනේසේගේ නිර්මල ශුද්ධත්වය විදහාපාන සංකේතයකි. යේසුස් වහන්සේට මෙපමණ වටිනා තෑගි දීමට අපට බැරිවුවත්, ඉතාමත්ම අගනා දීමනාව වන අපගේ සම්පූර්ණ ජීවිතය උන්වහන්සේට දීමට අපට පුළුවන.

# ශාස්ත්‍රවන්තයින් යේසුස්වහන්සේ නමස්කාර කළහ



ශාස්ත්‍රවන්තයින් යේසුස්වහන්සේව නමස්කාර කළ බව දෙවන කථාන්තරය පෙන්වා දෙයි. මරියා යේසුස් වහන්සේගේ ලෞකික මව පමණක් බැවින් ඔවුහු මරියාව නමස්කාර නොකළහ. උන්වහන්සේ කුරුසිය මත මැරුණ අවස්ථාවේ උන්වහන්සේගේ ලෞකික මව යොහන්ට භාර දුන්හ. යොහන්ගේ ශුභාරංචියේ 19 : 26, 27 මෙසේ කියයි : එකළ යේසුස්වහන්සේ සිය මෑණියන් ළඟ සිටි, තමන් ප්‍රේම කළ ගෝලයා දැක : ''ස්ත්‍රිය මෙන්න ඔබේ පුත්‍රයා'' කියා තම මෑණියන්ට කීසේක. එවිට උන්වහන්සේ ගෝලයාට කථාකර: ''මෙන්න ඔබේ මව'' කියා කීසේක. උන්වහන්සේ ඇයට මෑණියන් නොකියා ස්ත්‍රිය කී බව අපට මෙතැනදී පැහැදිලිව පෙනෙයි. එමනිසා ගැලවුම්කරු ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස් පමණක් නමස්කාර කිරීමට අප ප්‍රවේසම් විය යුතු අතර කිසිම රූපයකට හෝ මිනිසෙකුට අප වැඳ නමස්කාර නොකළ යුතුයි. පළමු කථාන්තරයේ ඇති යේසුස්වහන්සේගේ එම්මානුවෙල් යන අනිත් නම මතකද ? ''දෙවියන්වහන්සේ අප සමගය'' යනු මෙහි තේරුම වෙයි. යේසුස්වහන්සේ දෙවියන්වහන්සේ බව මෙය අපට උගන්වයි. උන්වහන්සේ අප ලොවට කුඩා දරුවෙකු මෙන් පැමිණ මිනිසුන් අතර වැඩීමට පටන්ගත්

දිනය ඉතාමත් අලංකාරය, යහපත්ය. යේසුස්වහන්සේ මනුෂ්‍යයන් වෙත මාංසාකාරව පැමිණි දෙවියන්වහන්සේය. (යොහන් 1:1–14 ; කොලොස්සි 2:9 ; මතෙව් 12:50 කියවන්න.)

## 3. යොහන් බෞතීස්ත යේසුව බෞතීස්ම කළේය



(මතෙව් 3:1–6 සහ 13–17)

එදවස යොහන් බෞතීස්ත යුදයේ වනයේ දේසනා කරමින්: පසුතැවිලි වෙන්න, මක්නිසාද ස්වර්ග රාජ්‍යය ළඟ යයි කීවේය. කුමක් හෙයින්ද ස්වාමීන්ගේ මාර්ගය පිළියෙල කර උන්වහන්සේගේ මාවත් සමතලා කරන්න යැයි වනාන්තරයෙහි හඬක් ඇසෙන්නේය කියා අනාගතවක්තෘ යෙසායා කීවේ මොහු ගැනය. මෙම යොහන් ඔටුරෝම වස්ත්‍ර ඇඳ ඉහටියේ හම්පටියක් බැඳ සිටියේය. පළගැටියන් හා වන මී ඔහුගේ ආහාරය විය. යෙරුසලමේද, මුළු යුදයේද, යොර්දන අවට මුළු පළාතේද වැසියෝ ඔහු වෙතට පැමිණ තමන්ගේ පව් කියා දෙමින් යොර්දන් ගඟින් ඔහුගෙන් බෞතීස්ම ලැබුවෝය. එකල යේසුස් වහන්සේ යොහන්ගෙන් බෞතීස්ම වීමට ගලීලයේ සිට යෝර්දනයට ආසේක. නුමුත් යොහන් උන් වහන්සේ වළක්වමින් : ඔබගෙන් බෞතීස්මය ලබන්ට මට යුතුව තිබියදී ඔබ මා වෙතට එනසේක්දැයි කීවේය. යේසුස්වහන්සේ ඔහුට උත්තර දෙමින් : දැනට ඉඩ හරින්න. මක්නිසාද මෙසේ සියලුම ධර්මිෂ්ඨකම් සම්පූර්ණ කරන්ට අපට සුදුසු යයි කීසේක. එවිට ඔහු උන්වහන්සේට ඉඩ හැරියේය. යේසුස්වහන්සේ බෞතීස්ම ලැබ එකෙනෙහිම දියෙන් ගොඩ ආසේක. බලව අහස උන්වහන්සේට විවර විය. දෙවියන්වහන්සේගේ ආත්මයාණන් පරවියෙකු මෙන් බසිමින් තමන් මත පැමිණෙනවාද උන් වහන්සේ දුටුසේක. තවද : මොහු මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය. මම මොහු කෙරෙහි ප්‍රසන්නව සිටිමියි, අහසෙන් හඬක් විය.

# ඔබ කළ යුතු දෙය

නිවැරිදි වචනයෙන් හිස්තැන් පුරවන්න. සෑම පිළිතුරක්ම තෙවන කථාන්තරයේ ඇත.

1. මෙම පණිවුඩය යොහන් බෞතීස්ත දේසනා කළේය—'' පසුතැවිලි වෙන්න, මක්නිසාද ......................රාජ්‍යය ළඟය.''

2. යොහන් අනුභව කළේ................. හා ..................


3. බෞතීස්මවීම පිණිස යොහන් වෙත පැමිණියේ කවුද?..................

4. යේසුස්වහන්සේ දියෙන් ආ පසු දෙවියන්වහන්සේගේ ආත්මය උන්වහන්සේ මත .............. මෙන් පැමිණිසේක.

5. අහසින් හඬක් මෙසේ කීවේය: මොහු මාගේ ප්‍රේමවන්ත ............ මම මොහු කෙරෙහි ප්‍රසන්නව සිටිමි.

# පසුතැවිලිවීම යනු කුමක්ද ?

පසුතැවිලිවීම කියනුයේ අප කළ හෝ නොකළ යම් දෙයකට දුක්වීම හා නැවතත් යහපත් හා නිවැරිදි දෙය කිරීමට අප හද තුල ඇති කැමැත්තටය. පසුතැවිලිවීම නම්, වැරදි දෙයින් හැරී යහපත් දෙය කිරීමය. අපි කරන වැරදි දෙයට පාපය කියා කියමු. ඇත්තෙන්ම, දෙවියන්වහන්සේව සතුටු නොකරන සෑම දෙය පාපය වෙයි. සැබෑ පසුතැවිල්ල අප හද තුළ වෙනස් වීමක් ඇති කරයි. එක් කුඩා දැරියක් මෙසේ කීවාය : ''පසුතැවිලිවීම නම් වැරදි දෙය සහමුලින්ම අත්හැරීම පිණිස නැඟෙන කණගාටුවයි.''



අප යේසුස්ට යාඥා කළ විට එවැනි දෙය අත්හැරීමට උන්වහන්සේ අපට බලය දෙති. පව්කාර සිතක් පිරිසිදු සිතකට හැරවීමට යේසුස් වහන්සේට පුළුවන. ''උන්වහන්සේ අප පව් ඉවතලා'' උන්වහන්සේගේ ආත්මය අප හද තුළට දමනසේක. ඔබ කවදා හෝ ස්වාමිවූ යේසුස්-වහන්සේට, ඔබ සිත තුළට පැමිණීමට ඇරයුම් කර තිබෙනවාද?

මෙම කුඩා දැරිය යේසුස්වහන්සේට යාඥා කර ඇයගේ පව් ගැන දුක් වන බව උන්වහන්සේට කියයි. ඇය කළ සියලු වැරදිවලට කණගාටු වන බැවින් යේසුස්වහන්සේ එම යාඥාව අසා ඇයට සමාවාදී, යහපත් දෙය

පමණක් කිරීමට උන්වහන්සේ ඇයට උපකාර කර ලස්සණ පිරිසිදු සිතක්ද දෙනසේක. සැමදින යේසුස්වහන්සේට යාඥා කරන නිසා උන්වහන්සේව සතුටු කිරීමට තව තවත් ඇය ශක්තිමත් වෙයි.

## අසමාන්‍ය සාක්ෂිකරුන්

යේසුස්වහන්සේගේ විශේෂ බෞතීස්මයේ දී දේවත්වය සිටිසේක.

1. ''මොහු මාගේ ප්‍රේමවන්ත පුත්‍රයාය, මම මොහු කෙරෙහි ප්‍රසන්නව සිටිමි'' යනුවෙන් ස්වර්ගයේ සිට කථා කළ දෙව්වූ පියාණන්වහන්සේ.

2. යොහන්, බෞතීස්ම කළ දෙව්වූ පුත්‍රයා. උන්වහන්සේ අපව පාපයෙන් ගැළවීමට පැමිණි හෙයින් උන්වහන්සේගේ මනුෂ්‍යය නම යේසුස් විය.

3. පරවියෙකුමෙන් ස්වර්ගයෙන් පැමිණ යේසුස්වහන්සේ මත වැඩම වූ දෙව්වූ ශුද්ධත්මයාණන්වහන්සේ.

මෙම තුන් ආකාරයට උන්වහන්සේව අපට පෙන්නුම් කිරීමට අප කෙරෙහි ඇති දෙවියන්වහන්සේගේ ප්‍රේමය කොපමණ මහත්ද ?

# 4. යක්ෂයා යේසුස්වහන්සේව පරික්ෂා කරයි



(මතෙව් 4:1–11)

එකල යේසුස්වහන්සේ යක්ෂයා විසින් පරික්ෂා කිරීම පිණිස ආත්මයාණන්වහන්සේ විසින් වනාන්තරයට පමුණුවන ලදහ. උන්වහන්සේ දවල් හතලිහක්ද, රාත්‍රී හතලිහක්ද නිරාහාරව සිටි පසු උන්වහන්සේට බඩගිනි විය. එවිට පරික්ෂකයා (යක්ෂයා) උන්වහන්සේ වෙතට පැමිණ : ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් මේ ගල් රොටී වෙන්ට අණ කරන්නැයි කීවේය. එතුමා උත්තර දෙමින් : මනුෂ්‍යයා දෙවියන්වහන්සේගේ මුඛයෙන් නික්මෙන සියලු වචන වලින් ජීවත්වනවා මිස, රොටී පමණකින් ජීවත් නොවන්නේය කියා ලියා තිබේයයි කීසේක. එවිට යක්ෂයා උන්වහන්සේව ශුද්ධ නුවරට ගෙන ගොස් දේව මාළිගාවේ මුදුනේ සිටුවා : ඔබ දෙවියන් වහන්සේගේ පුත්‍රයා නම් පහතට පනින්න; කුමක් හෙයින්ද, උන්-වහන්සේ තමන් දූතයන්ට ඔබ ගැන අණ දෙනසේක. ඔබේ පය ගලක නොවදින ලෙස ඔහු තම අත්පිට ඔබ උසුලා ගන්නෝය කියා ලියා තිබේ යයි උන්වහන්සේට

කීවේය. යේසුස්වහන්සේද : තාගේ දෙවිවූ ස්වාමින්වහන්සේ පරීක්ෂා නොකරව කියාද ලියා තිබේ යයි ඔහුට කීසේක. නැවතත් යක්ෂයා උන්වහන්සේව ඉතා උස් කන්දකට ගෙන ගොස්, ලෝකයේ සියලු රාජ්‍යයන් ද එහි ඓශ්වර්‍ය්‍යය ද උන්වහන්සේට පෙන්වා : ඔබ බිම වැටී මට නමස්කාර කරන්නෙහි නම්, මේ සියල්ල ඔබට දෙන්නෙමියි උන්වහන්සේට කීවේය. එවිට යේසුස්වහන්සේ : දෙවි වූ ස්වාමින්ට නමස්කාර කරන්න; උන්වහන්සේට පමණක් සේවය කරන්න කියා ලියා තිබේ යයි ඔහුට කීසේක. එකල යක්ෂයා උන්වහන්සේ අත්හැර ගියේය. බලව, දේවදූතයෝ පැමිණ එතුමාට උපස්ථාන කළහ.

## ඔබ කළ යුතු දෙය

අ. පහත ඇති ප්‍රශ්නවලට සතරවන කථාන්තරයෙන් පිළිතුරු සපයන්න.

1. නිරහාරව සිටීම නම් කෑම අනුභව නොකර සිටීමයි. යේසුස් වහන්සේ දවල් හා රාත්‍රි කීයක් නිරහාරව සිටිසේක් ද?

2. වනාන්තරයේ දී යේසුස්වහන්සේව පරීක්ෂා කිරීමට පැමිණියේ කවුද ? ......................................

3. ගල්........................හරවන ලෙස යක්ෂයා යේසුස්වහන්සේට කීවේය.

4. .................මුදුනෙහි සිට පනින ලෙස යක්ෂයා යේසුස්වහන්සේට කීවේය.

5. බිම වැටී...........................නමස්කාර කරන ලෙස යක්ෂයා යේසුස්වහන්සේට කීවේය.

ආ. මෙම පදය ඉගෙනගන්න;

''ඔබගේ දෙවිවූ ස්වාමින්වහන්සේට නමස්කාර කරන්න ; උන්වහන්සේට පමණක් සේවය කරන්න.''—මතෙව් 4:10

## යේසුස්වහන්සේ යක්ෂයාට කීකරු නොවූහ

යේසුස්වහන්සේව කීකරු කරගැනීමෙහි ලා යක්ෂයා බොහෝ වෑයම් කළේය. උන්වහන්සේ සාතන්ගේ හඬ හඳුනති. (සතර වන කථාන්තරයේ භාවිතා වන සාතන් යන නම යක්ෂයාට ඇති තවත් නමකි). යේසුස් වහන්සේගේ බලය අනිසි ලෙස පාවිච්චි කරලීම පිණිස උන්වහන්සේව පෙළඹවීමට යක්ෂයා තැත් කළේය. මෙයට ''පරීක්ෂාව'' යයි කියයි. වැරදි දෙය කිරීම පිණිස ඔහු යේසුස්වහන්සේව පරීක්ෂා කළේය. නුමුත්

යේසුස්වහන්සේ යක්ෂයාට කීකරු නොවී, ඔහුගෙන් ජයගෙන පව් නොකළහ. උන්වහන්සේට පරීක්ෂාවල් තුනක් පැමිණි මුත් ඉන් එකකටවත් කීකරු නොවූහ. උන්වහන්සේට බිම වැටී ඔහුට නමස්කාර කරන ලෙස යක්ෂයා කී අන්දම කල්පනාකර බලන්න. කිසිදිනක අප යක්ෂයාට නමස්කාර නොකළ යුතුයි. එය වැරදි දෙයකි. යක්ෂයාගේ හඬට යේසුස්වහන්සේ කීකරු වූවා නම්, මෙලොව සම්පත්වලින් උන්වහන්සේට ධනවත්වීමට තිබුණි. නුමුත් යක්ෂයාට කීකරු වී ඔහුට සේවයකර මෙම ධනවත්කම ලබාගැනීමට උන්වහන්සේට වුවමනා නොවූහ. අපද එසේ ප්‍රවේසම් විය යුතුයි. වංචාවෙන්, සොරකමින් හා ස්වාමිවූ යේසුස්වහන්සේව ප්‍රතික්ෂේප කිරීමෙන් සැප සම්පත් සොයන්න එපා. කොපමණ දුප්පත් වුවත්, අප ජීවිතවල පළමු ස්ථානය යේසුස් වහන්සේට පිරිනමා, උන්වහන්සේගේ කැමැත්ත පමණක් කළ යුතුය. අපට සදකාල ජීවනය දෙන පිණිසත්, යම් දිනක අප උන්වහන්සේ වෙත ගොස් සදකාලිකව ජීවත්වන පිණිසත් යේසුස්වහන්සේ අප වෙනුවෙන් දුප්පත් වූසේක (2 කොරින්ති 8 : 9).

බලය අනිසි ලෙස පාවිච්චි නොකර, සොබාදහමේ සියලු නීතිවලට ගරුකර, ශරීරය නිසි සෞඛ්‍යය තත්වයේ අප තබාගත යුතුය. යේසුස් වහන්සේ දේව මාළිගාවේ මුදුනේ සිට බිමට නොපැන මෙය අපට පෙන්වා දුන්සේක. තවද අප ශරීරයට වේදනා හා රිදීම් වුවමනාවෙන් දිය නොයුතුයි.


## යේසුස්වහන්සේ භාවිතා කළ රහසක්

වැරදි කරලීමට යක්ෂයා යේසුස්වහන්සේව පරීක්ෂා කළ සියලු අවස්ථා-වලදීම එතුමා දේව වචනය භාවිතා කළහ. අපද මෙය කළ යුතුයි. දෙවියන් වහන්සේගේ වචනය වන බයිබලය අපට කියවීම පිණිස උන්වහන්සේ දී තිබේ. බයිබලය කියවීමෙන් අප ශක්තිමත් වෙයි. යක්ෂයාගෙන් ජය ගන්නා පිණිස අප බොහෝ බයිබල් පද ඉගෙන ගත යුතුයි. යම්කිසි පරීක්ෂාවක් අප කෙරෙහි බලපෑ විට එය පාපයක් නොමවෙයි. නුමුත් එයට අවනත වූ විගස එය අපට පාපය වෙයි. බයිබලයේ හෙබ්‍රෙව් 4:15 මෙසේ කියයි : ''අප මෙන්ම යේසුස්වහන්සේවද පරීක්ෂා කරනු ලැබූ නුමුත්, උන්වහන්සේ පව් නොකළසේක.'' යක්ෂයාගේ කිසිම පරීක්ෂා-වකට යේසුස්වහන්සේ කිසිවිටක කීකරු නොවූහ.

## මෙය මතක තබාගන්න

ඔබව වැරදි කිරීමට පොළඹවන ඕනෑම හඬක් සාතන්ගේ හඬ බැවින් එය දෙවියන්වහන්සේගේ හඬ නොවන්නේය. එමනිසා යක්ෂයාගේ හඬට කීකරු නොවන පිණිස ඔබව ශක්තිමත් කිරීමට, එවෙලෙහිම යේසුස් වහන්සේට යාඥා කරන්න. එවිට ඔබව වැරදි කිරීමෙහිලා පෙළඹවීමට නොහැකි බව දත් යක්ෂයා යේසුස්වහන්සේගෙන් ඉවත ගිය ලෙස ඔබෙන්ද ඉවත්ව යයි.

# 5. යේසුස්වහන්සේ සහකරුවන් තෝරාගනිති



(මතෙව් 4:17–22)

එතැන් සිට යේසුස්වහන්සේ: පසුතැවිලිවෙන්න; මක්නිසාද ස්වර්ග රාජ්‍යය ළං වී තිබේ කියා දේසනා කිරීමට පටන්ගත්සේක. එතුමා ගලීලයේ මුහුද අසළ ඇවිදින කළ මසුන් අල්ලන සහෝදරයන් දෙදෙනෙක් වන පේතෘස් නම් සීමොන්ද, ඔහුගේ සහෝදර ඇන්ඩෘද, මුහුදේ දැලක් හෙලනවා දැක: මා අනුව එන්න, මම නුඹලාව මනුෂ්‍යයන් අල්ලන්නන් කරමියි කීසේක. එකෙනෙහිම ඔවුහු දැල් අත්හැර උන්වහන්සේ අනුව ගියහ. උන්වහන්සේ එතැනින් පිටත්ව තවත් සොයුරන් දෙදෙනෙක් වන සෙබදීගේ පුත්‍ර යාකොබ් හා ඔහුගේ සහෝදර යොහන්ද, තම පියා සෙබදී සමග ඔරුවේ සිට දැල් අලුත්වැඩියා කරනවා දැක, ඔවුන්ට අඬගැසූසේක. එකෙනෙහිම ඔවුහු ඔරුවද තම පියාවද අත්හැර උන් වහන්සේ අනුව ගියහ.

## ඔබ කළ යුතු දෙය

අ. හිස්තැන් පුරවන්න. පිළිතුරු පස්වන කථාන්තරයේ ඇත.

1. සීමොන් පේතෘස්ගේ සහෝදරයාගේ නම කුමක්ද?.................

2. මෙම සොහොයුරන් දෙදෙනා මුහුදට දමමින් සිටියේ කුමක්ද?.........

3. සෙබදිගේ පුත් යාකොබ්ගේ සොයුරගේ නම කුමක්ද? ..............

4. මෙම සොහොයුරන් දෙදෙනා අලුත්වැඩියා කරමින් සිටියේ කුමක්ද?

   .........................

ආ. මෙම සහෝදරයන්ට යේසුස්වහන්සේ පැවසූ මෙම පදය ඉගෙනගන්න—

"මා අනුව එන්න. මම නුඹලා මනුෂ්‍යයන් අල්ලන්නන් කරන්නෙමි."

## යේසුව අනුගමනය කිරීමට මහත් කැඳවීමක්

උන්වහන්සේව අනුගමනය කිරීම පිණිස ස්වාමි වූ යේසුස්වහන්සේගේ කැඳවීම මෙම මසුන් අල්ලන්නන්ට මහත් ප්‍රීතියක් ගෙන දුන්නේය. ඔවුහු එකෙනෙහිම ප්‍රීතියෙන් කීකරු වූහ. දැන් දැල්වලින් මසුන් ඇල්ලීම වෙනුවට ඔවුහු යේසුස්වහන්සේ හට මනුෂ්‍යයන් අල්ලති. යේසුස්වහන්සේට බොහෝ අනුගාමිකයන් ඕනැකර තිබේ. සැබැවින්ම, උන්වහන්සේව අනුගමනය කිරීමට අප සියලුදෙනාවම උන්වහන්සේ කැඳවති. ඔබ යේසුස්වහන්සේ අනුව ගමන් කරනවාද ? එසේ නැත්නම් එසේ කරන්න. ඔබ ඒ ගැන සිතා තිබෙනවාද? උන්වහන්සේ අනුව එන පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ කැඳවීම, අපට ලැබෙන උසස්ම කැඳවීමයි. උන්වහන්සේව අනුගමනය කිරීම නම් සදාකල ජීවනයයි. යොහන් 14:6 යේසුස්වහන්සේ මෙසේ කියති: ''මාර්ගයද සැබෑවද ජීවනය ද මමය. මා තුළින් මිස කිසිවෙක් පියාණන්වහන්සේ වෙතට පැමිණෙන්නේ නැත.''

## 6. ක්‍රිස්තුස්වහන්සේ ඉගැන්වූ දෙය



(මතෙව් 5 : 1—12)

උන්වහන්සේ සමූහයක් දැක කන්දට නැග්ගහ. උන්වහන්සේ හිඳගත් කල උන්වහන්සේගේ ගෝලයෝ උන්වහන්සේ වෙත පැමිණියහ. එවිට උන්වහන්සේ මුඛය හැර ඔවුන්ට උගන්වමින් මෙසේ කීසේක: සිතින් දිළින්දෝ ආශිර්වාද ලද්දෝය, මක්නිසාද ස්වර්ග රාජ්‍යය ඔවුන්ගේය. ශෝකවන්නෝ ආශිර්වාද ලද්දෝය, මක්නිසාද ඔවුහු සනසනු ලබන්නෝය; මොලොක් ගුණ ඇත්තෝ ආශිර්වාද ලද්දෝය; මක්නිසාද ඔවුහු පොළොව උරුම කර ගන්නෝය ; ධර්මිෂ්ඨකමට පිපාසය ඇත්තෝ ආශිර්වාද ලද්දෝය, මක්නිසාද ඔවුහු සෑහීමට පැමිණෙන්නෝය ; දයාවන්තයෝ ආශිර්වාද ලද්දෝය, මක්නිසාද ඔවුහු දයාව ලබන්නෝය ; සිතින් පවිත්‍රව සිටින්නෝ ආශිර්වාද ලද්දෝය, මක්නිසාද ඔවුහු දෙවියන්වහන්සේ දකින්නෝය ; සමාදනය කරන්නෝ ආශිර්වාද ලද්දෝය, මක්නිසාද ඔවුහු දෙවියන්වහන්සේගේ පුත්‍රයන් යයි කියනු ලබන්නෝය ; ධර්මිෂ්ඨකම නිසා පීඩා විඳින්නෝ අශිර්වාද ලද්දෝය, මක්නිසාද ස්වර්ගරාජ්‍යය ඔවුන්ගේය. මනුෂ්‍යයන් මා නිසා නුඹලාට නින්ද පීඩා කොට, නුඹලාට විරුද්ධව සියලු ආකාර අගුණ බොරුවෙන් කියන කල නුඹලා ආශිර්වාද ලද්දෝය. ප්‍රීතිවන්න, ඉතා සන්තෝෂවන්න, මක්නිසාද ස්වර්ගයේ නුඹලාගේ ත්‍යාගය මහත්ය. නුඹලාට පළමුවෙන් සිටි අනාගතවක්තෘන්ටත් ඔවුහු එසේම පීඩා කළෝය.

# දයාවන්තයෝ ආශිර්වාද ලද්දෝය

එක් දිනක් මනුෂ්‍යයෙක් භයානක රටක් තුළින් ගමන් කරද්දී කකුලක් තුවාල වූ බල්ලෙක් ඔහුට හමුවිය. ඔහු බොහෝ වේලාවක් එම බල්ලාව ඉතා හොඳින් පරීක්ෂා කළ පසු, කටුවක් ඇනී තිබෙන බව දැක ඉතා ප්‍රවේසමෙන් එම කටුව ගලවා බල්ලාගේ කකුල සෝද තම ලේන්සු-වෙන්ම එතීය. ඉන්පසු බල්ලා යන්ට ගියේය.

ටික දිනකට පසු මෙම මිනිසාව ඉන්දියානුවන් විසින් අල්ලා මරුමුවට පත් කිරීම පිණිස ඔහුව සිරකර තිබුණි. එක්විටම, මෙම ඉන්දියානු නායකයාගේ බල්ලා ඔහු වෙත දුවගොස්, ඔහුගේ අත් ලෙවකන්ටත් සෑම ආදරයක්ම පෙන්වීමටත් පටන් ගත්තේය. පසුව, තම බල්ලාව බේරාගනු ලැබුවේ මෙ මිනිසා විසින් බව දැනගත් ඉන්දියානු නායකයා, ඔහුගේ එම යහපත් ක්‍රියාවට ස්තුතිකර ඔහුව නිදහස් කර හැරියේය.

''දයාවන්තයෝ ආශිර්වාද ලද්දෝය, මක්නිසාද ඔවුහු දයාව ලබති.''

# දේව ආශිර්වාද

භයවන කථාන්තරයේ ''ආශිර්වාද ලද්දෝය'' කියා නව සැරයක් ඇත. අපි මෙයට ''දේව ආශිර්වාද'' යයි කියමු. දෙවියන්වහන්සේ අපට පනත් දහයක් දුන් නමුත්, යේසුස්වහන්සේ අපට දී තිබෙන්නේ දේව ආශිර්වාද නවයක් පමණි. එනමුත් බයිබලයේ එළිදරව් 22:14 අපට තවත් ''දේව ආශිර්වාදයක්'' දී තිබේ. එනම් ''ජීවන වෘක්ෂයට පැමිණීමට අයිතිවාසිකම ලැබෙන පිණිසත්, දොරටුවලින් නුවරට ඇතුල්වන්නට පුළුවන් වන පිණිසත් තම සළු සෝදගත්තා වූ තැනැත්තෝ ආශිර්වාද ලද්දෝය'' යනුයි.

# 7. කෙසේ යාඥා කළ යුතුදැයි යේසු අපට උගන්වති



(මතෙව් 6 : 5–15)

තවද නුඹලා යාඥා කරන කළ වංචාකාරයන් කරන්නාක් මෙන් නොකරන්න. මක්නිසාද, මනුෂ්‍ය-යන්ට පෙනෙන පිණිස ඔවුහු සිනගෝගවල හා මංසන්ධිවල සිට-ගෙන යාඥා කිරීමට සතුටු වෙති. සැබවක් නුඹලාට කියමි: ඔවුන්ගේ විපාක ඔවුන්ට ලැබී තිබේ. නුමුත් නුඹ යාඥා කරන කළ, නුඹේ ඇතුල් ගෙට වැද දොර වසා, රහසිගතව

සිටින නුඹේ පියාණන්වහන්සේට යාඥා කරන්න. එවිට රහසින් දකින නුඹේ පියාණන්වහන්සේ නුඹට ප්‍රසිද්ධියේ විපාක දෙනසේක. තවද යාඥා කිරීමේදී, අන්‍යාය ජාතීන් මෙන් නිරර්ථක වචන නොකියන්න. ඔවුහු, ඔවුන්ගේ වචන රාශිය නිසා අසනු ලබතියි සිතති. එබැවින් ඔවුන්ට සමාන නොවන්න. මක්නිසාද, නුඹලාගේ පියාණන් වහන්සේගෙන් නුඹලා යමක් ඉල්ලන්ට ප්‍රථම, නුඹලාට වුවමනා දෙය කුමක්දැයි එතුමා දන්නාසේක. එහෙයින් ඔබලා මෙසේ යාඥා කරන්න: ස්වර්ගයෙහි වැඩ සිටින අපගේ පියාණෙනි, ඔබගේ නාමයට ගෞරව වේවා, ඔබගේ රාජ්‍යය ඒවා. ඔබගේ කැමැත්ත ස්වර්ගයෙහි මෙන් පොළොවෙහිද ඉෂ්ට කරනු ලැබේවා. අපේ දවස් පතා භෝජනය අපට අද දුන මැනව. අපේ ණයකරුවන්ට අපි කමා කළාක් මෙන්, අපේ ණයටත් කමා කළ මැනව. අප පරීක්ෂාවට නොපමුණුවා, නපුරෙන් අප ගලවාගත මැනව්. මක්නිසාද, රාජ්‍යයත්, බලයත්, මහිමයත්, සදාකාලයටම ඔබගේය. ආමෙන්.

නුඹලා මනුෂ්‍යයන්ට ඔවුන්ගේ වැරදි කමා කරත් නම්, නුඹලාගේ ස්වර්ගීය පියාණන් නුඹලාටත් කමා කරති. නුමුත් නුඹලා මනුෂ්‍යයන්ට ඔවුන්ගේ වරද කමා නොකරත් නම්, නුඹලාගේ පියාණන්ද නුඹලගේ වරදත් කමා නොකරනසේක.

## ඔබ කළ යුතු දෙය

අ. අපට යාඥා කරන පිණිස යේසුස්වහන්සේ ඉගැන්වූ යාඥාව, පහත තිබෙන අතර මෙහි සමහර වචන අත්හැර ලියා ඇත. හත්වන කථාන්තරය නැවත කියවා හිස්තැන් පුරවන්න.

........................ වැඩ සිටින අපගේ පියාණෙනි, ඔබගේ නාමයට ගෞරව වේවා. ඔබගේ රාජ්‍යය ඒවා. ඔබගේ කැමැත්ත.................... මෙන් ........................... ඉෂ්ට කරනු ලැබේවා. අපේ දවස්පතා ..................... අද අපට දුන මැනව. අපේ ..................අප කමා කළාක් මෙන් අපේ ණයත් කමා කළ මැනව. අප පරීක්ෂාවට නොපමුණුවා ......................... අප ගලවා ගත මැනව. මක්නිසාද රාජ්‍යයත්, ....................., .................. සදාකාලයටම ඔබගේය. ආමෙන්.

ආ. එම යාඥාව ඉගෙන ගන්න. එය ආදර්ශ යාඥාවකි. එමෙන්ම සැබෑවූ යාඥාවන්ට මග පෙන්වන්නකි. මෙම යාඥාවෙන් බොහෝ දෙය අපට ඉගෙන ගැනීමට පුළුවන—

1. අපේ පියාණන් ස්වර්ගයේය. උන්වහන්සේ අපේ පියාණන්ය. උන්වහන්සේ අපව මවා අපට ප්‍රේම කරනසේක.

2. උන්වහන්සේගේ නාමය සුලුව භාවිතා නොකළ යුතුයි. එතුමගේ නාමය ශුද්ධව තැබිය යුතුයි. ඔබගේ නාමයට ගෞරව වේවා.

3. ස්වර්ගයෙහි සිටින සැමදෙනම දෙවියන්වහන්සේගේ කැමැත්ත කරති. පෙළොවෙහිද, උන්වහන්සේගේ කැමැත්ත කරන මෙන් අප යාඥා කළ යුතුයි. සියල්ලෝම උන්වහන්සේගේ කැමැත්ත කරත් නම් අප මිහිතලය කොපමණ වෙනස් වෙයිද!

4. අප දවස්පතා භෝජනය සමග ඕනෑම ඉල්ලීමක් පියාණන්ගෙන් ඉල්ලීමට අපට පුළුවන. අපේ සැබෑවූ සියලු ඉල්ලීම් උන්වහන්සේ සම්පූර්ණ කරති. අප ජීවන ගැටළු විසඳා ගැනීමටද උන්වහන්සේ අපට පිහිට වෙති.

5. අප අන් අයට සමාවෙන්නේ කෙසේද? අප අන්‍යයන්ට සමාවෙන තරමටම යේසුස්වහන්සේද අපට සමාව දෙනසේක. අප හදවතෙහි තරහව, ද්වේශ කිරීම, නපුර, අශුභදෙය, පලිගැනීම යන මේවා තිබේ නම් අපට සමාව දීමට දෙවියන්වහන්සේට නුපුළුවන. අන්‍යයන් අපට කළ වැරදිවලට අප සැබෑ ලෙස සමාවූ විට, උන්වහන්සේ අපේ වැරදිවලට සමාවෙනවා ඇත.

6. පරීක්ෂාවෙන් හා නපුරෙන් අප ගළවාගැනීම පිණිස දෙවියන් වහන්සේට සියලු බලය ඇත.

7. රාජ්‍යයද, බලයද, මහිමයද, දෙවියන්වහන්සේ බැවින්,අප ඉල්ලන සැමදෙයම අපට දීමට උන්වහන්සේට පුළුවන.

# 8. දෙවියන්වහන්සේගේ දිනපතා සැලකීම



(මතෙව් 6: 25-34)

එහෙයින් නුඹලාට කියමි: කුමක් කමුද, කුමක් බොමුද කියා ජීවිතය ගැනවත්, කුමක් අඳිමුද කියා ශරීරය ගැනවත් කනස්සලු නොවන්න. කෑමට වඩා ජීවිතයද, ඇඳුමට වඩා ශරීරයද, උතුම් නොවේද? අහසේ පක්ෂීන් බලන්න. එවුන් වපුරන්නේවත්, කපාගන්නේවත්, අටුවල රැස්කර ගන්නේවත් නැත; නුමුත් නුඹලාගේ ස්වර්ගීය පියාණන් ඔවුන් පෝෂණය කරනසේක. නුඹලා ඔවුන්ට වඩා බොහෝ

වටිනවා නොවේද? කනස්සලුවීමෙන් තම උසට රියනක් එක්කර ගන්ට නුඹලා අතරෙන් කවරෙකුට පුළුවන්ද? නුඹලා ඇඳුම් ගැන කුමක් නිසා කනස්සලු වන්නහුද? කෙතේ ලිලී මල් වැඩෙන හැටි කල්පනා කරන්න. ඒවා වෙහෙසෙන්නේවත්, නූල් කටින්නේවත් නැත. එහෙත් සොලමන් පවා ස්වකීය ඓශ්වර්යයෙහිද, ඒවායින් එකක් ලෙසවත් පැළඳී නොසිටි බව නුඹලාට කියමි. මද ඇදහිල්ල ඇත්තෙනි, අද තිබී හෙට උදුනෙහි දමනු ලබන්නාවූ කෙතේ තෘණ දෙවියන්වහන්සේ මෙසේ පළඳවනසේක් නම්, ඊට වඩා කොපමණ වැඩියෙන් නුඹලාව පළඳවත්ද? එහෙයින් කුමක් කමුද, කුමක් බොමුද, කුමක් අඳිමුද කියමින් කනස්සලු නොවන්න. මක්නිසාද මේ සියල්ලම අන්‍ය ජාතිහු සොයති. මේ සියල්ල නුඹලාට ඕනෑ බව නුඹලාගේ ස්වර්ගීය පියාණන් වහන්සේ දන්නාසේක. නමුත් පළමුව දෙවියන් වහන්සේගේ රාජ්‍යයද, උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමද සොයන්න. එවිට මේ සියල්ල ඔබට දෙනු ලැබේ. එබැවින් හෙට දවස ගැන කනස්සලු නොවන්න. හෙට දවස, ඒ දවස ගැනම කරදර වන්නේය. දවසේ කරදරය ඒ දවසට සෑහෙයි.

## ඔබ කළ යුතු දෙය

මෙම පදය ඉගෙන ගන්න—

"පළමුව දෙවියන්වහන්සේගේ රාජ්‍යයද, උන්වහන්සේගේ ධර්මිෂ්ඨකමද සොයන්න. එවිට මේ සියල්ලම ඔබට දෙනු ලැබේ." —මතෙව් 6 : 33

## කුරුල්ලන්ගේ පාඩම

කුඩා කුරුල්ලන් අහසේ පියාසර කරනවා බලා සිටියාද? කිසිම කරදරයක් හෝ භයක් නැති ඔවුන් ප්‍රීතිමත්ය. සෑම උදෑසනකම අවදිවී ගී ගයමින්, තම ආහාරවලට සැමද ස්තුතිවන්ත වෙති. හෙට කෑම ලැබෙන බව දන්නා එවුන් හෙට ගැන කනස්සලු නොවෙති. තමන් ගැන සැලකිලිමත් වන පිණිස එවුන් දෙවියන්වහන්සේව විශ්වාස කරති.

ඔබත්, මමත්, මේ සියොතුන් සේ සෑම උදෑසනම ඉතා සතුටු සිතින් දෙවියන්වහන් ස්ට ප්‍රශංසා ගී ගයා හෙට ආහාරය ගැන කනස්සලු නොවිය යුතුයි. කුරුල්ලන් මවා, දිනපතා එවුන්ට ආහාර සොයාගැනීමට පිහිට වන දෙවියන්වහන්සේ, අපටද දවස් පතා ආහාර ලබාගැනීමට පිහිටවෙති. අප උන්වහන්සේව විස්වාස කළ යුතුය. බොහෝ කුරුල්ලන්ට වඩා අප අගනේය.

## ලිලී මලේ පාඩම

ඔබ ලිලී මල් දැක තිබෙනවාද? ඒවා බොහෝ විට කෙත්වල වැවෙන කෝප්ප වැනි ලස්සන මල් වර්ගයකි. එහි පෙති අලංකාරය. ඉතා බලවත් හා ධනවත් සොලමන් රජුටත් වඩා අලංකාරව මෙම ලිලී මල් අන්දවා තිබෙන බව යේසුස්වහන්සේ කීසේක. එනමුත්, එමල් අඳින දෙය ගැන කනස්සලු නොවෙයි. එමන්ද දෙවියන්වහන්සේ ඒවායේ අලංකාරය දී, ඉතා ලස්සන පාටින් සරසා ඇති බැවිනි. අපද, අප ඇඳුම් උදෙසා දෙවියන්වහන්සේව විශ්වාස කළ යුතුය. උන්වහන්සේ අප මැවූසේක. එබැවින් අප ඇඳුම් උදෙසා දෙවියන්වහන්සේව විශ්වාස කිරීම උන්වහන්සේගේ කැමැත්තය. අප ලිලී මල්වලට බෙහෝ අගනේය.

## ඉතාම වැදගත් දෙය

අපට ඇති දෙවියන්වහන්සේගේ පොරොන්දුව, ඉගෙනීමට දුන් පදයේ ඇත. පළමුවෙන් දෙවියන්වහන්සේව සෙවිය යුතුයි. තවද උන්වහන්සේ අප මනසේ, සිතේ, ජීවිතයේ පළමු ස්ථානය ගෙන සිටිය යුතු අතර, ලොව ඇති සියලු දෙයට වඩා අප දෙවියන්වහන්සේ වෙනුවෙන් ජීවත් වී, උන්වහන්සේට ප්‍රේම කළ යුතුයි. අප උන්වහන්සේට පළමු ස්ථානය දුන්විට අපේම පුද්ගලික ආරක්ෂාවට වඩා උන්වහන්සේ බොහෝ සෙයින් අපව ආරක්ෂා කරනසේක.

# 9. අපට ඇති දෙවියන්වහන්සේගේ යහපත්කම


(මතෙව් 7 : 7-12)

ඉල්ලන්න, එවිට නුඹලාට දෙනු ලැබේ; සොයන්න, එවිට නුඹලාට සම්භවේ; තට්ටු කරන්න, එවිට නුඹලාට දෙර අරිනු ලැබේ. මක්නිසාද, ඉල්ලන සියල්ලන්ට ලැබේ; සොයන්නාට සම්භවේ; තට්ටු කරන්නාට දෙර අරිනු ලැබේ. නුඹලා අතරෙන් කවර මනුෂ්‍යයෙක් තම පුත්‍රයා රොටියක් ඉල්ලන විට ඔහුට ගලක් දේද? නැතහොත් ඔහු මත්ස්‍යයෙකු ඉල්ලන විට ඔහුට

සර්පයෙකු දේද? නපුරු වූ නුඹලා නුඹලාගේ දරුවන්ට මෙසේ යහපත් දෙය දීමට දනිත් නම්, ස්වර්ගයෙහි සිටින නුඹලාගේ පියාණන් වහන්සේ උන්වහන්සේගෙන් ඉල්ලන්නන්ට මීට වැඩියෙන් යහපත් දෙය නොදෙනසේක්ද? එබැවින් මනුෂ්‍ය යන් විසින් නුඹලාට යම් දෙයක් කරනවාට නුඹලා කැමතිද, එලෙසම නුඹලාත් ඔවුන්ට කළ යුතුයි. ව්‍යවස්ථාවත් අනාගත වාක්‍යයත් මෙයය.

## ඉහත ශුද්ධ ලියවිල්ලෙන් ඉගෙන ගතයුතු දෙය

1. දෙවියන්වහන්සේ යාඥාවට උත්තර දෙන බැවින් ස්වර්ගයේ සිටින අපගේ පියාණන්වහන්සේට පමණක් අප යාඥා කළ යුතුය.

2. අපගේ සවර්ගීය පියාණන්වහන්සේගේ ප්‍රේමය අප දෙමව්පියන්ගේ ප්‍රේමයට වඩා අතිශයින් උසස්ය. එමනිසා උන්වහන්සේ අපට යහපත් දෙය දෙනසේක. නැතහොත් අපට යහපත් වන දෙය දෙනසේක.

3. අවංකව දෙවියන්වහන්සේව සොයන්නාට විපාක ලැබේ.

4. බයිබලයේ සියලු ඉගැන්වීම් මෙම උත්තම සත්‍යතාවය ගෙන එයි.

''අන්‍යයන් අපට යම් දෙයක් කරනවාට අප කැමතිද, එලෙසම අප අන්‍යයන්ට කළ යුතුය.''

''අන්‍යයන්'' කියනුයේ අප ජාතියට හෝ ඇදහිල්ලට අයිති අය පමණක් නොව, නුමුත් ලොව වෙසෙන සියලු මනුෂ්‍යයන්ටය.

## ඔබ කළ යුතු දෙය

මෙම ප්‍රධාන පදය ඉගෙන ගන්න. මෙයට රන් අණ යයි කියයි.

''මනුෂ්‍යයන් විසින් නුඹලාට යම් දෙයක් කරනවාට නුඹලා කැමතිද, එලෙසම නුඹලාත් ඔවුන්ට කළ යුතුයි.'' -මතෙව් 7:12

## රන් අණ කර ඇති දෙය

මනුෂ්‍යයෝ රන් අණට කීකරු වී, එය අනුගමනය කළ විට, පුදුම දෙය සිදුවෙති. මෙන්න ඉන් සමහරක්:

1. රෝගීන්ට ආරෝග්‍යශාලා ගොඩනගා ඇත.

2. දුගීන්ට, මව්පියන් නැති ළමුන්ට හා කිසිවෙකුගේ පිහිටක් නැති මහලු අයට නිවෙස් තනා ඇත.

3. සිරගෙවල් දියුණුකර, පිරිසිදු කර ඇත.

4. මනුෂ්‍යයන්ව නිදහස් කර ඇති අතර ඔවුන්ව වහලුන් මෙන් මිලයට ගනු හෝ විකුණනු නොලැබේ.

5. ආහාර හා ඇඳුම් දුගීන්ට දෙනු ලැබේ.

6. මනුෂ්‍යයෝ එකිනෙකාට ප්‍රේමකර එකිනෙකාගේ බර සැහැල්ලු කිරීමට උපකාර වෙති.

7. තම බලය යට සිටින අය ආරක්ෂා වන ලෙස නායකයෝ නීතිරීති සාදති.

8. ඔවුන්ට නිදහස වුවමනා ලෙසම, දෙවියන්වහන්සේව නමස්කාර කිරීම පිණිස අන්‍යයන්ටද නිදහස දී ඇත.


## ඔබෙන්ම ඇසිය යුතු හොඳ ප්‍රශ්නයක්

රන් අණ අනුගමනය කරන ආකාරය ගැන ඔබට නිසි පැහැදීමක් නැත්නම්, නැතහොත් ආගන්තුකයෙකුට, මිත්‍රයෙකුට හෝ සතුරෙකුට සැලකීමට ඔබට මනා අවබෝධයක් නැත්නම් මෙම ප්‍රශ්ණය ඔබෙන්ම අසන්න.

"මා දැන් ඔහුගේ තත්වයේ සිටී නම්, ඔහු මට කුමක් කරනවාට මම කැමතිද?"

මෙයට, අවංකව පිළිතුරු දීමට ඔබට හැකිද? එහෙනම් එසේම කරන්න. එවිට ඔබ රන් අණ අනුගමනය කර ඇත.

# 10. ගොඩනැගිලිකරුන් දෙදෙනා



(මතෙව් 7:24-29)

එහෙයින් යමෙක් මාගේ වචන අසා ඒවා පිළිපදිද, ඔහු පර්වතය මත තම නිවස සාදගත් නුවණැති මිනිසාට සමාන කරනු ලබන්නේය. වැසි වැස, ජලය ගලා, සුළඟ හමා, ඒ නිවසට ගැසුවේය. එය පර්වතය මත පිහිටා තිබුණු බැවින් නොවැටුණේය. යමෙක් මාගේ වචන අසා ඒවා පිළිනොපදිද ඔහු වැලි මත, තම නිවස සාදගත් අනුවණ මිනිසෙකුට සමාන කරනු ලබන්නේය. වැසි වැස, ජලය ගලා, සුළඟ හමා ඒ නිවසට ගැසුවේය. එය වැටුණේය. එහි වැටීමද බලවත් විය. යේසුස් වහන්සේ මෙම වචන කියා නිමකල පසු සමූහයා උන්වහන්සේගේ ඉගැන්වීම් ගැන විශ්මයට පත්වූහ. මක්නිසාද උන්වහන්සේ ඔවුන්ගේ ලියන්නන් මෙන් නොව බලය ඇති කෙනෙකු මෙන් ඔවුන්ට ඉගැන්වූ නිසාය.

# ඔබ කළ යුතු දෙය

දහවන කථාන්තරයේ ඇති නිසි වචන ගෙන පහත හිස්තැන් පුරවන්න.

1. යේසුස්වහන්සේගේ වචන අසා ඒවා පිළිපැදි මිනිසා, තම නිවස පර්වතයක් මත ගොඩනැගූ ............................................ මිනිසෙකුට සමාන කරනු ලැබේ.

2. යේසුස්වහන්සේගේ වචන අසා ඒවා පිළිනොපැදි මිනිසා, තම නිවස වැලි මත ගොඩනැගූ ............................................ මිනිසෙකුට සමාන කරනු ලැබේ.

# නුවණැති ගොඩනැගිලිකරු

නුවණැති මිනිසා මෙන් සිටීමට අපට වුවමනා නම්, යේසුස්වහන්සේගේ වචන අසා ඒවා **පිළිපැදිය** යුතුයි. යේසුස්වහන්සේගේ වචන බයිබලයේ තිබේ. උන්වහන්සේගේ වචන බොහෝමයක් අප දූන් ඉගෙන ගන්නා මතෙව් ශුභාරංචියේද තිබේ. යේසුස්වහන්සේගේ වචන මත අප ජීවිත ගොඩනගා උන්වහන්සේව අනුගමනය කළ විට, ජීවිතයේ සැඩ කුණාටු පැමිණියත් අපි ආරක්ෂා වී සිටිමුව. 'ජීවිතයේ කුණාටු' කියා අප අදහස් කරනුයේ, පරීක්ෂාවල්, උසුලන්ට නොහැකි දුෂ්කරතා, දුක, වේදනා කරදර යන මේවාටය. යේසුස් ක්‍රිස්තුස්වහන්සේ පර්වතයක් මෙන්ය. උන්වහන්සේ විශ්වාසය, ස්ථිරය, සෙලවීමට නුපුළුවන. එබැවින් අප ජීවිත උන්වහන්සේ මත ගොඩනැගූ කළ උන්වහන්සේ අපව තරයේ අල්ලා ගන්නාසේක. එවිට අපව උන්වහන්සේගෙන් වෙන් කිරීමට සැමදෙයම අසමත් වෙයි. නුවණැති ගොඩනැගිලිකරුවකු වීමට ඔබ කැමති නම්, මෙදූන් යේසුස්වහන්සේට සිතට ඒමට ඉඩදෙන්න. යේසුස්වහන්සේ ඔබ සිතට ඒමට සිටින බැවින්, යාඥාකර උන්වහන්සේට සිත තුළට එන්ට කියන්න. ඔබ හදවත නැමති දෙරටුව ඇර තබන්න. එවිට යේසුස්වහන්සේ ඔබ තුළට පැමිණෙති.

# අනුවණ ගොඩනැගිලිකරු

සමහර මිනිසුන් දෙවියන්වහන්සේගේ වචනයට කීකරු නොවෙති. එම වචන අසා ඒවා අමතක කර දමන ඔවුන් අනුවණ මිනිසා මෙන්ය. ජීවිතයේ සැඩ කුණාටු හමා ආ කළ, ඒවාට මුහුණ පෑමට අසමත්ව වැලි මත සෑදූ නිවස මෙන් ඔවුහු කඩා වැටෙති. මෙය භයානකය. ඔවුහු යේසුස් ක්‍රිස්තුස්වහන්සේට තම සිත් තුළට ඒමට ඉඩ නොදී උන්වහන්සේගේ වචනවලට කීකරු නොවී කල් යවති.

## යාඥාවක්




අනේ යේසුනි, මාගේ සියලු පව්වලට සමාව මට නිර්මල සිතක් දෙන්න. මගේ සිතිවිලි, වචන හා ක්‍රියාවලට මග පෙන්වමින් සැමද මා තුළ ජීවත්වන්න. ආමෙන්.

එළිදරව් 3:20 යේසුස්වහන්සේ ඔබට මෙම වචන පවසයි: ''මෙන්න මම දෙර (සිත) ළඟ සිට තට්ටු කරමි. යමෙක් මගේ හඬ අසා දෙර (සිත) ඇරි විට මම ඔහු වෙතට ඇතුල්ව ඔහු සමග කෑම කන්නෙමි. ඔහුද මා සමග කන්නේය.''

## මෙම පදය ඉගෙනගන්න

''වචනය අසන්නෝ පමණක් නොව, එය පිළිපදින්නෝද වෙන්න.''
—යාකොබ් 1 : 22

## 11. කුණාටුව හා මුහුද යේසුස්වහන්සේට කීකරුවෙති



(මතෙව් 8 : 23 -27)

උන්වහන්සේ ඔරුවකට නැගුණු කළ, ගෝලයෝ උන්වහන්සේ අනුව ගියෝය. බලව, ඔරුව රළින් වැසී යන තරමට මුහුදේ මහත් කුණාටුවක් විය ; නුමුත් උන්වහන්සේ නිදිව සිටිහ. එවිට ඔවුහු උන්වහන්සේ වෙත පැමිණ එතුමා පුබුදුවා: ස්වාමිනි, අප ගලවා ගත මැනව, අපි විනාශ වන්නෙමු යයි කීහ. උන්වහන්සේද: මද ඇදහිල්ල ඇත්තෙනි, කුමක් නිසා බිය වෙම්දැයි ඔවුන්ට කියා, නැගිට සුළඟටත්, මුහුදටත් සැර කළහ. එවිට මහත් නිසලක් විය. ඒ මිනිසුන් මවිතව: මෙතුමා කෙබඳු කෙනෙක්ද? සුළඟ හා මුහුද ද උන්වහන්සේට කීකරුවෙයි කියා පැවසුහ.

# මුහුදු කුණාටුවක්


යේසු හා ගෝලයෝ නැවක යාත්‍රා කරමිනුයි සිටියේ. යේසු වෙහෙසට පත්ව සිටි නිසා එතුමා නින්දට ගියා. අප සමිඳු එසේ සිටින විට මහත් කුණාටුවක් හටගත්තා. ඒ හේතුවෙන් විශාල මුහුදු රළින් නැව පිරුණු හෙයින් බයට පත් ගෝලයෝ යේසුව නැගිට්ටෙව්වා. එතුමා ළඟ සිටියදීත් ඔවුන් හයවූ නිසා යේසු පුදුම වෙන්ට ඇති නේද? නුමුත් ඔවුන්ගේ මද ඇදහිල්ල දුටු එතුමා නැගිට, කුණාටුවට හා මුහුදට නිසල වීමට අණ කළා. එකෙනෙහිම මුහුද චංචලව නිසල වුනා. ඔවුන් දන්නා සියලු මිනිසුන්ට වඩා වෙනස් මිනිසෙක් එතැන සිටින බව ගෝලයන් තේරුම් ගත්තා. ඇත්තෙන්ම මෙම මිනිසා නම් දෙවියන් වහන්සේගේ පුත්‍රයාය! කුණාටුවත්, මුහුදත් යේසුට තවමත් කීකරු වෙනවා.

## මෙය මතක තබාගන්න

අවුරුදු ගණනාවකට ඉහත දී එක් මවක් තම කුඩා දූවරුන් දෙන්නා සමග නැවක ගමන් ගන්නා විට, යම් අනතුරකින් නැව ගිලෙන්නට පටන් ගත්තා. නැවේ මගීන් හයෙන් සිටි අතර, මෙම මවද, දූවරුන්ද යේසුස්වහන්සේට ප්‍රේමකර උන්වහන්සේව විශ්වාස කලා. ඔබ දන්නවද වැඩිමහල් දියණිය සිය මවට කී දෙය? ''අම්මේ, අපි දෙවියන් වහන්සේගේ සැළකීම්වලින් තොරව නොවෙයි ඉන්නේ. මේ මුහුද උන්වහන්සේ සෑදූ නිසා, මුහුද උන්වහන්සේගෙයි. එමනිසා එහි ගිලෙන්ට හයවෙන්න ඕනෑ නැහැ.'' කාන්තිමත් මුහුණුවලින් යුතුව එම ගැඹුරු මුහුදේදී, ඔවුන් මරුවාට තුරුලු වුනා. මාගේ ප්‍රිය මිතුරු මිතුරියනි, මතක තබාගන්න:

**යේසුස්වහන්සේ අප සමග නිසා සදකාල අනතුරක් අපට සිදු නොවෙයි**

# 12. යේසු ගැන අන්‍යයන්ට අප පැවසිය යුතුයි



(මතෙව් 10 : 28 - 33)

ශරීරය නසන නමුත් ආත්මය නසන්නට නුපුළුවන් අයට හය නොවන්න. එහෙත් ආත්මයද, ශරීරයද නිරයේ විනාශ කරන්ට පුළුවන් තැනැන්වහන්සේට හය වෙන්න. ගේ කුරුල්ලන් දෙදෙනෙකු සතයකට නොවිකුණද්ද? එහෙත් ඔවුන්ගෙන් එකෙකුවත් නුඹලාගේ පියාණන්වහන්සේ නොදනුවත්ව බිම වැටෙන්නේ

නැත. නුඹලාගේ සියලු හිසකේ පවා ගණන්කර තිබේ. එබැවින් භය නොවන්න. නුඹලා ගේ කුරුල්ලන් බොහෝ දෙනෙකුට වඩා වටිති. එබැවින් මනුෂ්‍යයන් ඉදිරියේ දී: ඔහු අඳුනමියි මා ගැන කියන යමෙක් ඇද්ද, ස්වර්ගයෙහි සිටින මා පියාණන් ඉදිරියේ ද මමත් ඔහු අඳුනමියි කියන්නෙමි. නමුත් මනුෂ්‍යයන් ඉදිරියේ දී ඔහු නාඳුනමියි මා ගැන කියන යමෙක් ඇද්ද, ස්වර්ගයේ සිටින පියාණන් ඉදිරියේදී මමත්, ඔහු නාඳුනමියි කියන්නෙමි.

## ක්‍රිස්තුස්වහන්සේ ගැන ප්‍රකාශ කිරීම අවශ්‍යයි

මෙලොව දී අප උන්වහන්සේ ගැන මනුෂ්‍යයන්ට ප්‍රකාශ කළ විට, උන්වහන්සේද ස්වර්ගයේ සිටින පියාණන්ට අප ගැන ප්‍රකාශ කරන බවට පොරොන්දු වී ඇත. මෙය මොන සතුටක්ද! උන්වහන්සේ වෙනුවෙන් වචනයෙන් හා ක්‍රියාවෙන් පෙනී සිටීම, උන්වහන්සේව ප්‍රකාශ කිරීමයි. යේසුස්වහන්සේ ගැන හා අපව පාපයෙන් ගළවාගැනීමට හැකි එතුමාගේ මහත් උතුම් මවිත බලය ගැන ඔබ අන්‍යයන්ට පවසනවාද? යේසුස්වහන්සේ ඔබව ගළවා ඔබට කළ යහපත් දෙය ගැන අන්‍යයන්ට කියා තිබෙනවාද? මිනිසුන් අතර උන්වහන්සේව ප්‍රකාශ කිරීමෙහිලා, අප කළ යුතු සුළු දෙයකි ඒ.

අප යේසුස්වහන්සේ ගැන ලැජ්ජා වී, උන්වහන්සේ වෙනුවෙන් කථා නොකර, උන්වහන්සේ අපට අණ කළ දෙය කිරීමට අසමත් වූයේ නම්, මනුෂ්‍යයන් ඉදිරියේ උන්වහන්සේව අප ප්‍රතික්ෂේප කර ඇත. මෙය ඉතා භයානකය; එමෙන්ම අප සමිඳුගේ සිතට දුක ගෙන දෙයි. එබැවින් යේසුස්වහන්සේගෙන් සමාව ඉල්ලා, උන්වහන්සේ ඉදිරියේ ප්‍රසන්න දෙය කිරීමට පිහිට ලබාගැනීම පිණිස අප උන්වහන්සේව විශ්වාස කළ යුතුය. එවිට යේසුස්වහන්සේද, ස්වර්ගයේ සිටින දෙවියන්වහන්සේ ඉදිරියේ දී අපව ප්‍රකාශ කරති.

## අප මනුෂ්‍යයන්ට භය නොවිය යුතුයි

සමහර මිනිසුන් බොහෝ නපුරු බැවින් ඔවුන්ගේ ක්‍රියා දරුණුය. සමහර විට ඔවුහු මිනී මරති. ඔවුන්ට ශරීරය මැරීමට හැකි වෙතත්, ආත්මය මැරීමට බැරිය. අප නොමැරෙන කොටස නම් ආත්මයයි. අප මැරුණාට පසු, එය දුන්නාවූ අප දෙවියන්වහන්සේ වෙතට නැවත යයි. "තවද එක්වරක් මරණයත්, ඉන්පසු විනිශ්චයත් මිනිසාට නියමව තිබේ." (හෙබ්‍රෙව් 9 : 27). අප ක්‍රියා ගැන දෙවියන්වහන්සේට අප ගණන් දිය යුතුයි. රෝම 14:12 මෙසේ කියයි: "එහෙයින් අප එකිනෙකා තම තමා ගැන දෙවියන්වහන්සේට ගණන් දිය යුතුව ඇත." එමනිසා අප භය විය යුතු දෙවියන්වහන්සේට පමණක්ය. "දෙවියන්වහන්සේට භයව එතුමාගේ

පනත් පවත්වන්න. මෙය මිනිස් යුතුකමකි. සියලු යහපත් හෝ නපුරු ක්‍රියා හා රහස්, දෙවියන්වහන්සේ විනිශ්චයට පමුණුවනසේක'' යයි, දේශනාකාරයා 12 : 13, 14 කියා තිබේ.

මිනිසා අපට විරුද්ධව කරන දෙයට භය නොවන ලෙස දෙවියන් වහන්සේ කියා තිබේ. ඔවුන් අපට එරෙහිව නපුරු බස් කී විට හෝ අපට චෝදනා නැගූ විට හෝ අපව නැසීමට තැත්කල විට හෝ උන්වහන්සේව විශ්වාස කරන මෙන් දෙවියන්වහන්සේ පවසා ඇත. දෙවියන්වහන්සේ සියලු දෙය දන්නාසේක! ඔබගේ හිසේ තිබෙන කෙස් ගණනද උන්වහන්සේ දන්නාසේක. කුඩා ගේ කුරුල්ලෙක් හෝ වෙන කුරුල්ලෙක් බිමට වැටුණු කළද උන්වහන්සේ දන්නාසේක ! අප කුරුල්ලන්ට වඩා බොහෝ වටිනා බැවින් උන්වහන්සේ අපව කවදාවත් අමතක නොකරති. හෙබ්‍රෙව් 13 : 5 දෙවියන්වහන්සේ මෙසේ කියති: ''මම කිසිසේත් ඔබෙන් අහක්ව නොයමි, කිසි අන්දමකින්වත් ඔබව අත්නාරිමි.''

# 13. වපුරන්නාගේ උපමාව



(මතෙව් 13 : 1 - 9 සහ 18 - 23)

එදවස් යේසුස්වහන්සේ නිවසින් පිටත්ව මුහුද අසල හිඳගත්සේක. බොහෝ සමූහයන් උන්වහන්සේ වෙත රැස්වූ බැවින් උන්වහන්සේ ඔරුවකට නැගී හිඳගත්සේක. මුළු සමූහයා වෙරළෙහි සිටියෝය. උන්වහන්සේ ඔවුන්ට බොහෝ කාරණා උපමාවලින් කීහ. බලව, වපුරන්නා වපුරන්නට ගියේය. ඔහු වපුරන කළ සමහර බීජ මග අසල වැටුණේය. පක්ෂීහු පැමිණ ඒවා අහුලා කෑවෝය. සමහරක් වඩා පස් නැති ගල් බිම්වල වැටී, පස් ඝනව නොතිබුණ බැවින් ඒවා වහාම පැල විය. නමුත් ඉර උදාවූ කළ අව්වෙන් දැවී මුල් නැති බැවින් වියළී ගියේය. අන් සමහරක් කටු අතරෙහි වැටුණේය. කටුගස් වැවී ඒවා යට කර දැම්මේය. තවත් සමහරක් සරු බිමෙහි වැටී, එල දැරිය. එකෙන් සියයක්ද, එකෙන් හැටක්ද, එකෙන් තිහක්ද බැගින් එල දුන්නේය. ඇසීමට කන් ඇත්තෝ අසත්වයි කීසේක.

එබැවින් වපුරන්නාගේ උපමාව අසන්න. යමෙක් රාජ්‍යයේ වචනය අසා තේරුම් නොගත්තේද ඔහුගේ සිතේ වැපුරු දෙය නපුරා පැමිණ උදුරා ගත්තේය. මග අසල වපුරන ලද්දේ නම් ඔහුය. ගල් බිම්වල වපුරන ලද්දේ නම්, වචනය අසා එකෙනෙහිම සන්තෝෂයෙන් පිළි ගන්න තැනැත්තාය. එහෙත් තමා

තුළ මුල් නැති බැවින් ඔහු ටික කලක් පැවති, වචනය නිසා හිංසාවක් හෝ පීඩාවක් පැමිණි කෙනෙහිම බාධා වන්නේය. කටු අතරෙහි වපුරන ලද්දේ නම්, වචනය අසා ලෝකය ගැන වෙහෙසීමෙන්ද, වස්තුවේ රැවටිලිකාරකමින්ද වචනය යට වීමෙන් ඵල නොදරන තැනැත්තාය. සරු බිමෙහි වපුරන ලද්දේ නම් වචනය අසා තේරුම් ගෙන ඵල දරන තැනැත්තාය. එක් කෙනෙක් සියයක්ද, එක්කෙනෙක් හැටක්ද, එක්කෙනෙක් තිහක්ද ඵල දෙන්නේ යයි කීසේක.

## උපමාව නම් කුමක්ද?

උපමාව නම්, චරිතයක් හෝ ආගමික සත්‍යතාවයක් පහද දීමට ඇති කෙටි කථාන්තරයකි.

## ඔබ කළ යුතු දෙය

අ. පහත සඳහන් වාක්‍යයන් සම්පූර්ණ කරන්න. නැවතත් කථාන්තරය කියවා, නිවැරදි වචනයෙන් හිස්තැන් පුරවන්න. පළමුවන ප්‍රශ්නය සම්පූර්ණකර ඇත.

1. මග වැටුණු බීජ පක්ෂීහු අහුලා කෑවෝය.

2. ගල් බිම්වල වැටුණු බීජවලට..............................සනව නොතිබුණු බැවින් ඉර උදාවූ කළ අව්වෙන්.............................. මුල් නැති බැවින්..............................ගියේය.

3. කටු අතරෙහි වැටුණු බීජ..............................වැවී ඒවා යටකර දැම්මේය.

4. සරු බිමෙහි වැටුණු බීජ බොහෝ..............................දැරීය.

## උපමා විස්තරය

ආ. උපමාවේ තේරුම දැනගැනීමට නැවත කථාන්තරය කියවා, නිවැරදි වචනයෙන් හිස්තැන් පුරවන්න. පළමු ප්‍රශ්නය සම්පූර්ණ කර ඇත.

1. මග අසළ වැටුණු බීජ නම්, දෙවියන්වහන්සේගේ රාජ්‍යයේ වචනය අසා එය..............................නොගන්නා අය මෙන්ය. එවිට නපුරා පැමිණ ඔවුන්ගේ සිතින් සත්‍යය පැහැර ගන්නේය.

2. ගල් බිමේ වැටුණු බීජ නම්.............................. අසා එය සන්තෝෂයෙන් පිළිගත් අය මෙන්ය. වචනයට ඔවුන්ගේ සිතෙහි වැඩී ඉඩක් නැති හෙයින්, වචනයට මුල්දැරීමට නොහැකිය. පරීක්ෂාවල්ද, පීඩා හා හිංසාද පැමිණි විට ඔවුන්..............................වන්නේය.

3. කටු අතරෙහි වැටුණු බීජ නම්, වචනය ඇසූ නමුත් .................. ගැන වෙහෙසෙන, එනම් ගෙදර වැඩ, ඉවුම්පිහුම්, මැහුම්, ගෙතුම්, වෙළහෙළඳම් හෝ වෙන ආසාවන් සොයන අය මෙනි. තවද ලොවැති වස්තූන් ඔවුන්ව රවටා.......................... යටකර ඇති බැවින් ඔවුහු..................................නොදරති.

4. සරු බිමෙහි වැටුණු බීජ නම්, වචනය අසා තේරුම් ගන්නා අය මෙන්ය. එය ඔවුන් ප්‍රීතියෙන් පිළිගෙන, තම ජීවිතවල පළමුතැන දෙවියන්වහන්සේට දී තිබෙන හෙයින්, පරික්ෂාවල් හෝ පීඩා හෝ හිංසා පැමිණි විට ඔවුහු බාධා නොවෙති. දවසේ වුවමනාවන්ට ඔවුන්ව යටත් කිරීමට ඉඩ නොදෙන අතර ඔවුන්ගේ සිත් ලෞකික වස්තු මත නොමැත. නිරතුරුව අවදිව යාඥා කරන ඔවුහු දෙවියන්වහන්සේගේ පිහිට කෙරෙහි විශ්වාය කරති. එමනිසා ඔවුහු බොහෝ..........................දරති. සමහරෙක් සියයක්ද, සමහරෙක් හැටක්ද, සමහරෙක් තිහක්ද ගෙනෙති.

## ප්‍රශ්ණය: ඔබ කුමන වර්ගයේ අසන්නෙක්ද?

ඔබ සරු බිමෙහි වැටුණු බීජ මෙන් නොවේ නම් ස්වාමිවූ යේසුස් වහන්සේට යාඥාකර උන්වහන්සේට ඔබ තුළ වාසයට ඒමට ආරාධනා කරන්න. එවිට බොහෝ එල දැරීමට යේසුස්වහන්සේ ඔබට පිහිට වෙත්.

# 14. කුරුසිය සහ කිරුළ




(මතෙව් 16 : 24 - 28)

එවිට යේසුස්වහන්සේ ගෝල යන්ට කථාකර: යමෙක් මා අනුව ඒමට සතුටු නම්, ඔහු ඔහුව නොසළකා, ඔහුගේ කුරුසිය රැගෙන මා අනුව එත්වා. මක්නිසාද යමෙක් ඔහුගේ ජීවිතය ගලවාගන්ට කැමතිවේද, ඒක ඔහුට නැති වන්නේය. මා නිසා ඔහුගේ ජීවිතය නැතිවෙන අයට එය සම්බවන්නේය. යම් මිනිසෙක් මුළු ලෝකය ලබාගත් පසු ඔහුගේ ජීවිතය නැති වුවහොත් ඔහුට කුමන ලාභයක්ද? නොහොත් මිනිසෙක් ඔහුගේ ජීවිතය වෙනුවට දෙන්නේ කුමක්ද? මනුෂ්‍යය පුත්‍රයා තම පියාණන්වහන්සේ තේජසින් යුතුව තම දූතයින් සමග එන්නේය; එකල එතුමා ඔවුන්ගේ ක්‍රියා අනුව විපාක දෙනසේක. සැබෑවක් නුඹලාට කියමි: මනුෂ්‍ය පුත්‍රයා ස්වකීය රාජ්‍යයෙන් ඒම දකින තෙක් මෙහි සිටින්නන්ගෙන් සමහරෙක් කිසිසේත් මරණය විඳින්නේ නැත.

# සියල්ලන්ටම කුරුසියක්

අපට යේසුස්වහන්සේව අනුගමනය කිරීමට වුවමනා නම් අප අපව නොසලකා යේසුස්වහන්සේ තුළ අපට ඇති කුරුසිය ගත යුතුයි. අප වෙනුවෙන් ඉසිලීමට යේසුස්වහන්සේට කුරුසියක් තිබිණ. මරණයෙන්, අපායෙන් හා මිනීවලෙන් අපව බේරාගැනීම පිණිස උන්වහන්සේ සිය තේජස හා සම්පත් අත්හැර ලොවට පැමිණිසේක ! අප නිසා උන්වහන්සේ බොහෝ දුක් වේදනා විඳදරාගත්සේක. හෙබ්‍රෙව් 12 : 2 මෙසේ කියයි:



"යේසුස්වහන්සේ තමන් ඉදිරියේ තිබුණු ප්‍රීතිය නිසා ලජ්ජාව නොසලකා, කුරුසිය දරාගෙන, පසුව දෙවියන්වහන්සේගේ සිංහාසනයේ දකුණු පැත්තෙහි වැඩ හිඳගත් සේක." ඔව්, දැන් යේසුස්වහන්සේ එතුමගේ සියලු තේජසට හා ප්‍රීතියට ගොස් ඇති බැවින්, අපට උන් වහන්සේ සමග සිටීමට ආරාධනා කරති. යොහන් 14 : 3 යේසුස් වහන්සේ මෙසේ පවසන සේක: "නුඹලාට ස්ථානයක් පිළියෙල කරන පිණිස යමි. මා සිටින ස්ථානයේ නුඹලාත් සිටින පිණිස, මා නැවත පැමිණ නුඹලා මා ළඟට ගන්නෙමි."

"ඔබව නොසලකා" යන්නෙහි තේරුම කුමක්ද? එනම්, අන්‍යයන්ගේ වුවමනාවන් සළකා තම වුවමනාව පරිත්‍යාගය කිරීමයි. බයිබලයක් නැති අයෙකුට හෝ යේසුස්වහන්සේ ගැන නොදත් කෙනෙකුට ශුභාරංචිය ප්‍රකාශ කිරීම පිණිස ඔබගේ මිළ මුදල් දෙන ලෙස යේසුස්වහන්සේ ඔබට කීමට පුළුවන ! නැතහොත් නිරහාරව සිට, යමෙකුගේ ආත්මය ගැන හෝ රෝගීව සිටින කෙනෙකු ගැන හෝ යාඥා කිරීමට උන්වහන්සේ ඔබට කියනු ඇත. ඔබට වුවමනා නැති දෙයක් මිළයට නොගන්නා ලෙසද එම මුදලින් දුප්පතුන්ට හා කුසගින්නේ පෙළෙන්නවුන්ට උපකාර කිරීමටද උන්වහන්සේ කියති. එලෙසම යම් ස්ථානයකට ගොස් උන් වහන්සේව ප්‍රකාශ කිරීමට, ඔබට කීමට බැරි නැත. දෙමාපියන් නැති දරුවන්ට සැළකීමට හෝ එම කුඩා දරුවන් දරුකමට ගෙන හද වඩා ගැනීමට උන්වහන්සේ ඔබට කීමට පුළුවන. මෙයාකාරයෙන් "ඔබව නොසලකා" අන්‍යයන්ට පිහිට වන ක්‍රම බොහෝ ඇත.

## මුළු ලොවට වඩා ඔබ ආත්මය වටියි

ඔබ වෙහෙස මහන්සියෙන් උපයාගත් දෙයින් ලොව ධනවතා වීමට බැරි නැත. එහෙත් යේසුස්වහන්සේට ප්‍රේම නොකර, උන්වහන්සේට පිටුපා ඔබගේ මිදුම්කරු සේ උන්වහන්සේව විශ්වාස නොකර සිටී නම් එයින් පලක් නොවේ. තවද ඔබගේ ආත්මය විනාශ වී යයි. එම අහිමි වූ සදකාල ජීවිතයට මෙහි ඇති කිසිම ලාභයකින් ගෙවීමට බැරිය. මිනිසෙක් ඔහුගේ ආත්මය වෙනුවට දෙන්නේ කුමක්ද? එක් මිනිසෙක් දෙවියන්වහන්සේට වඩා අන්‍යයන්ව හා ඔහුගේ පවුල සැනසීය. මෙයාකාරයෙන් ඔහු, තම ආත්මය, කීර්තිය සමග හුවමාරුකර ගත්තේය. ලොව ඇති පෙළඹීම්වලට හෝ නපුරු මිනිසුන් විසින් දෙන ලද ත්‍යාගවලට හෝ මිනිස් ආත්මය සමාන කළ නොහැක. අපට සමාවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේගෙන් වෙන් කරන කිසිම දෙයක් අප නොකළ යුතුයි.

## ඔබ කළ යුතු දෙය

මෙම පදය ඉගෙන ගන්න:

මතෙව් 16 : 27 - ''මක්නිසාද මනුෂ්‍යය පුත්‍රයා තම පියාණන්වහන්සේගේ තේජසින් යුක්තව තම දූතයන් සමග පැමිණෙති. එකල උන්වහන්සේ ඔවුන්ගේ ක්‍රියා අනුව විපාක දෙනසේක.''

## 15. යේසුස්වහන්සේ කුඩා දරුවන්ට ප්‍රේම කරති



(මතෙව් 18 : 10–14)

මේ බාලයන්ගෙන් එක් කෙනෙකු හෝ හෙළා නොදක්නා ලෙස බලා ගන්න. මක්නිසාද ස්වර්ගයේ දී ඔවුන්ගේ දූතයෝ ස්වර්ගයේ සිටින මාගේ පියාණන්වහන්සේගේ මුහුණ නිතරම දකිතියි නුඹලාට කියමි. නුඹලා සිතන්නේ කුමක්ද? යම් මිනිසෙකුට බැටළුවන් සියයක් ඇත්නම් එවුන්ගෙන් එකෙකු මුළාව ගිය විට, ඔහු ඉතිරි අනූනව දෙනා අත්හැර, කඳුවලට ගොස් මුළා වූ පැටවා සොයන්නේ නැද්ද? එම පැටවා සම්භවූ විට මුළාව නොගිය අනූනවදෙනාට වඩා එම පැටවා ගැන ප්‍රීතිවන්නේ යයි ඒකාන්තයෙන්ම නුඹලාට කියමි. එමෙන්ම මේ බාලයන්ගෙන් එක් කෙනෙකු වත් විනාශ වෙනවාට ස්වර්ගයෙහි සිටින ඔබලාගේ පියාණන්වහන්සේ කැමති නොවනසේක.

# මෙම කථාන්තරය අපට උගන්වන දෙය

1. කුඩා දරුවන්ට දේව දූතයන් ඇති බව හා එම දූතයන් ස්වර්ගයේ සිටින දෙවියන්වහන්සේගේ මුහුණ නිතරම දකින බවත්ය. එමනිසා අප එම ළමුන්ට යහපත් ලෙස සලකා යහපත් දෙය කිරීමට උදව් කළ යුතුය.

2. "මනුෂ්‍යය පුත්‍රයා" දෙවියන්වහන්සේගේ පුත්‍රවූ යේසුස්වහන්සේට ඇති තවත් නමකි. උන්වහන්සේ කන්‍යාය මරියා තුළින් උපත ලැබූ නිසා උන්වහන්සේට මනුෂ්‍ය පුත්‍රයා යයි කියනාතර, එතුමගේ පියාණන් දෙවියන් වහන්සේ වන නිසා එතුමාට දෙවියන්වහන්සේගේ පුත්‍රයා යයි කියති.

3. ක්‍රිස්තුස්වහන්සේගේ ලොව පැමිණීමේ පරමාර්ථය නම්, නැතිවූ අය ගළවාගැනීමටය.

4. නැතිවූ එක් බැටළුපැටවා සෙවීමට ගිය එම මිනිසා මෙන් යේසුස් ක්‍රිස්තුස්වහන්සේ අප සොයා පැමිණිසේක.

5. එම නැතිවූ බැටළුපැටවා සම්භ වූ පසු ඒ මිනිසා ප්‍රීතියෙන් ඉපිලී ගිය ලෙස උන්වහන්සේට අපව සොයාගැනීමට ඉඩ දුන් විට යේසුස් ක්‍රිස්තුස් වහන්සේද බොහෝ සෙයින් ප්‍රීතිවනසේක !

6. උන්වහන්සේ කෙරෙහි විශ්වාස කරන කීකරු දරුවෙක් සම්භවූ කළ යේසුස්වහන්සේ අතිශයින් ප්‍රීතිවනසේක ! එම ප්‍රේමනීය දරුවන් එක් කෙනෙකුවත් විනාශ වෙනවාට එතුමා අකමැතිය. නුමුත් සියල්ලන්ම ගැළවෙනවා දැකීම යේසුස්වහන්සේගේ පූර්ණ කැමැත්තය.

7. කුඩා දරුවන්ට යේසුස්වහන්සේ ගැන උගන්වා, ඔවුන්ව උන්වහන්සේ වෙත මග පෙන්වීම කොපමණ වැදගත්ද යන් මෙයින් අපට පෙනියයි.

# මෙනෙහි කිරීමට දෙයක්

ප්‍රශ්ණය: ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අදහාගන්නා දරුවෙකුව පන්නා දැමීමට තැත්කරන තැනැත්තාට කුමක් සිදුවේද?

පිළිතුර: මතෙව් 18 : 6 යේසුස්වහන්සේ මෙසේ කියති: "නමුත් මා කෙරෙහි අදහන මේ බාලයන්ගෙන් එක්කෙනෙකුටවත් බාධා කරන යමෙක් ඇද්ද, ඔහුගේ බෙල්ලේ මහත් ඇඹරුම් ගලක් එල්ලා, මුහුදේ ගැඹුරෙහි ගිල්වීම ඔහුට යහපත්ය."

## එතුමා වෙත ළමයින් ඒම යේසුගේ කැමැත්තය



(මාර්ක් 10 : 13 - 16)

ඔවුහු ළදරුවන් පිට උන්වහන් සේගේ අත තබාගන්නා පිණිස ඔවුන් උන්වහන්සේ වෙත ගෙනාහ. නුමුත් ගෝලයෝ ඔවුන්ට සැර කළහ. යේසුස්වහන්සේ එය දැක ඉතා අමනාප වී: ළදරුවන් මා ළඟට එන්න අරින්න, ඔවුන්ව වළක් වන්න එපා. මක්නිසාද දෙවියන් වහන්සේගේ රාජ්‍යය මෙබන්දන්ගේය. සැබැවක් නුඹලාට කියමි: යමෙක් දෙවියන්වහන්සේගේ රාජ්‍යය ළදරුවකු මෙන් පිළිනොගත් විට ඔහු කිසිසේත් එහි ඇතුල් නොවන්නේය. උන්වහන්සේ ළමුන් වඩාගෙන ඔවුන් පිට අත් තබා ආශිර්වාද කළසේක.

## 16. අප අන්‍යයන්ට කමාවිය යුතුයි



(මතෙව් 18 : 21 - 35)

එකල පේත්‍රුස් උන්වහන්සේ වෙතට පැමිණ: ස්වාමිනි, මට වරද කරන මාගේ සහෝදරයාට කී වරක් කමා වෙන්ටද? සත්වරක් දක්වාදැයි උන්වහන්සේගෙන් ඇසීය. යේසුස් වහන්සේ ඔහුට කථාකර: සත්වරක් නොව සැත්තෑවර සත්වරක් යයි කීවේය. එබැවින් තම දසයන් සමග ගණන් බැලීමට කැමතිවූ රජෙකුට ස්වර්ග රාජ්‍යය උපමා කරනු ලැබේ. ඔහු ගණන් බැලීමට පටන්ගත් කල තලෙන්ත දස දහසක් ණයවූ එක් අයෙක් ඔහු ළඟට ගෙනෙන ලදි. ණය ගෙවීමට ඔහුට කිසිවක් නොතිබුණු බැවින් ඔහුගේ ස්වාමියා ඔහුද ඔහුගේ භාර්යාවද, ඔහුගේ දරුවන්ද ඔහු සන්තක සියල්ලද වීකුණා ණය ගෙවීමට අණ කළේය. එවිට එම දසයා බිම වැටී වැඳ, ස්වාමිනි, මා ගැන ඉවසුව මැනව. ඔබතුමාට සියල්ලම ගෙවන්නෙමියි කීවේය, එම දසයාගේ ස්වාමියා

අනුකම්පා කර ඔහු මුද හැර ඒ ණය ඔහුට කමා කළේය. එහෙත් ඒ දසයා පිටත්ව ගොස්, ඔහුගේ සහකාර දසයන්ගෙන් ඔහුට මසු සියයක් ණයවූ එක්කෙනෙකු දැක, ඔහු අල්වා, ඔහුගේ බෙල්ල මිරිකා ණය ගෙවාපන්යයි කීවේය. එවිට ඔහුගේ සහකාර දසයා බිම වැටී මා ගැන ඉවසුව මැනව, නුඹට ගෙවන්න මියි කන්නලව් කළේය. නමුත් ඔහු අකමැතිව, ණය ගෙවන තුරු ඔහුව සිර කළේය. ඔහුගේ සහකාර දසයෙක් මේ සිදුවූ දෙය දැක ඉතා කණගාටුව තම ස්වාමියා වෙත පැමිණ සිදුවූ සියල්ල කීය. එවිට ඔහුගේ ස්වාමියා ඔහු කැඳවා, කථා කර: නපුරු දසය, නුඹ මගෙන් ඉල්ලූ නිසා ඒ ණය සියල්ලම නුඹට කමා කළෙමි. මා විසින් නුඹට කරුණා කළ සේම නුඹ විසින් නුඹේ සහකාර දසයාට කරුණා කරන්ට තිබුණේ නොවේදැයි කීවේය. ඔහුගේ ස්වාමියා කෝපව තමාට ණයවී තිබුණු සියල්ල ඔහු විසින් ගෙවන තුරු ඔහු වධකයන්ට භාර දුන්නේය. නුඹලාත් තම සහෝදරයන්ට සිතින් කමා නොක රනවා නම් ස්වර්ගයෙහි සිටින මාගේ පියාණන් වහන්සේද නුඹලාටත් එසේම කරනවා ඇතැයි කීසේක.

## මෙම කථාන්තරය අපට බොහෝ දෙය උගන්වයි

1. ''සැත්තෑවර සත්වරක්'' යයි කියනුයේ, කමාව දීමට අවසානයක් නැති බවය.

2. රජුට තලෙන්ත දසදහසක් ණයවූ නිසා එම දසයා විශාල ණය කරුවෙකු වී සිටියේය. එක් තලෙන්තයක් විශාල මුදලකි. එමනිසා දස දහසක්, අතිවිශාල මුදල් ප්‍රමාණයකි. මෙම ණය මුදල ඔහුට කිසි කලෙකත් ගෙවා නිම කිරීමට බැරි තරම්ය.

3. මෙය ගෙවන තෙක් ඉවසීමට යයි ඒ දසයා රජුට කී විට, එම රජ, සිය මහත් ප්‍රේමය නිසා ඔහුට අනුකම්පා කර ඒ ණය සියල්ලම කමා කළේය.

4. තම සහකාර දසයෙකුගෙන් ඔහුට ඒමට තිබූ සුළු මුදලක්, බලකර ඉල්ලීමෙන්, එම කරුණාවන්ත ක්‍රියාවට ඔහුගෙන් ලැබුණේ නපුරුකමය. රෝම කාසිවලින් මසු සියයක් සුළු මුදලකි. සිය සහකාර දසයාගේ බෙල්ල මිරිකා එය ඉල්ලීම කොපමණ නපුරු ක්‍රියාවක්ද? දෙවියන්වහන්සේට අප සියලු ක්‍රියා පෙනෙන නිසා, ඒ රජ සැළකූ ලෙස පළමු දසයා ඔහුගේ සහකරුට නොසැළකූ අන්දම උන්වහන්සේ දුටුසේක.

5. පළමු දසයා දුගී මිනිසාගේ කන්නලව්ව ඉවතලා මුදල් ගෙවන තුරු, ඔහුව දහගෙට දැම්මේය. දහ ගෙයින් පිට සිට ගෙවීමට අපහසු වූ ඔහුට, දැන් එය තුළ සිට ගෙවීමට කොපමණ අපහසුද?

6. මෙම නපුරු ක්‍රියාව ගැන රජුට දැනුම් දෙන ලදි. එම දසයාට සමාවදී තිබිලත් ඔහු නපුරුවූ නිසා රජ කෝප විය. සිය ණයකරුවාටද සමාව දීමට ඔහුට තිබුණි.

7. මෙම නපුරු දසයා සමාව නොදුන් නිසා, සියලු ණය ගෙවන තුරු ඔහුව සිරගෙට දමා හිංසා කළේය.

8. අප සිතින් අන්‍යයන්ට කමා නොකරත් නම්, අපටද මෙසේ සිදුවන බව යේසුස්වහන්සේ කියති.

9. අප සියලුදෙනම පව්කරුවන් බව දේව වචනය කියා දෙයි. රෝම 3 : 23 - ''සියල්ලෝම පව්කර දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනවී සිටිති.'' අප දෙවියන්වහන්සේගේ ඉදිරියේ අපිරිසිදුව සිටින බැවින් පාපයට වන්දි ගෙවීමට අපට නුපුළුවන. එබැවින් ධර්මිෂ්ඨ වූ නිර්මල, පාප රහිත යේසුස්වහන්සේ පැමිණ, අප පාපය වෙනුවෙන් කුරුසිය මත දිවි පුද එම වන්දිය ගෙවූසේක. උන්වහන්සේ අපව නිදහස් කළහ. 1 යොහන් 3 : 5 මෙසේ කියයි: ''පව් දුරුකරන පිණිස උන්වහන්සේව ප්‍රකාශ කරනු ලැබූ බව ඔබලා දනිති. කිසි පාපයක්ද උන්වහන්සේ තුළ නැත.''

10. යේසුස්වහන්සේ තුළින්, දෙවියන්වහන්සේ අප පාපයට කමා වී, එය ඉවතලා තිබෙන බැවින්, අපට වැරදි කළ අයටද සමාවෙන මෙන් උන්වහන්සේ අපෙන් ඉල්ලති. උන්වහන්සේ අපට සමාව දී අපව නිදහස් කර තිබෙන නිසා, අන්‍යයන්ට සමාව දීමෙන් අපේ ස්තූතිය අපි මුළු හදවතෙන් උන්වහන්සේට පෙන්වන්නෙමු.

## මතක තබාගන්න



යහපතට අයහපත කිරීම ඉතා දුෂ්ට නපුරු දෙයකි. බොහෝ අය යහපතට යහපත කරති. නුමුත් යේසු ක්‍රිස්තු සමිඳු මෙන් වීමට නම්, නපුරට යහපත කළ යුතුයි. සිය සතුරන්ට හා වධ හිංසා දුන් අයට යේසුස්වහන්සේ යාඥා කළසේක. යේසුස්වහන්සේගේ යාඥාව ලූක් 23 : 34 අපි මෙසේ කියවමු: ''පියාණෙනි, ඔවුන්ට කමාවුව මැනව, මක්නිසාද, ඔවුන් කුමක් කරන්නේද කියා නොදනිති.''

# 17. දුක්මුසු පොහොසත් මිනිසෙක්



(මතෙව් 19 : 16 - 26)

බලව, එක් අයෙක් උන්වහන්සේ වෙත පැමිණ: ආචාරිනි සදකාල ජීවනය ලැබගැනීමට කුමන යහපත් දෙයක් කළ යුතුදැයි උන්වහන්සේගෙන් ඇසුවේය. උන්වහන්සේද: ඔබ යහපත ගැන මගෙන් විචාරන්නේ මක්නිසාද? යහපත්ව සිටින්නේ එක් කෙනෙක්මය, එනම් දෙවියන්වහන්සේය. නමුත් ඔබ ජීවනයට ඇතුල්වීමට කැමැත්තෙහි නම්, පනත් පවත්වන්න යයි ඔහුට කීසේක. ඒ කුමන ඒවාදැයි ඔහු උන්වහන්සේගෙන් ඇසීය. යේසුස් වහන්සේ කියනසේක්: මිනි නොමරන්න, කාමමිථ්‍යාචාරය නොකරන්න, සොරකම් නොකරන්න, බොරු සාක්ෂි නොදෙන්න, නුඹේ පියාට හා මවට ගෞරව කරන්න, තමාට මෙන් තම අසල්වැසියාට ප්‍රේම කරන්න. යෞවනයාද : මේ සියල්ලම රක්ෂා කළෙමි. තව මට අඩු කිමෙක්දැයි උන්වහන්සේගෙන් ඇසීය. යේසුස්වහන්සේද ඔබ සම්පූර්ණ වීමට කැමති නම් ගොස්, ඔබ සන්තක දෙය විකුණා දිළිඳුන්ට දෙන්න. එවිට ස්වර්ගයෙහි ඔබට වස්තු ලැබෙන්නේය. මා අනුව ඔබ එන්න කියා ඔහුට කීසේක. නමුත් යෞවනයා ඒ කීම අසා ඔහුට බොහෝ සම්පත් ඇති කෙනෙක්ව සිටි බැවින් ශෝකයෙන් යන්ට ගියේය. එවිට යේසුස්වහන්සේ ගෝලයන්ට කථාකර : සැබැවක් ඔබලාට කියමි, ධනවතෙකුට ස්වර්ග රාජ්‍යයට ඇතුල්වීමට අසීරුය. නැවතත් ඔබලාට කියමි, ධනවතෙකුට දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වෙනවාට වඩා ඔටුවෙකුට ඉදිකටුවක සිදුරෙන් යෑමට පහසුය. ගෝලයෝ එය අසා ඉතා විස්මපත්ව එසේවී නම් ගැළවෙන්ට පුළුවන් කාටදැයි කීහ. යේසුස්වහන්සේ ඔවුන් දෙස බලමින් එය මනුෂ්‍යයන්ට නම් නුපුළුවන, නමුත් දෙවියන් වහන්සේට සියල්ලම පුළුවන් බව කීසේක.

## ඔබ කළ යුතු දෙය

අ. යේසුස්වහන්සේ විසින් පොහොසත් මිනිසාට අනුගමනය කරන්නැයි කී පනත් පහක් පහත ලියන්න.

1. ..........................................................................................

2. ..........................................................................................

3. ..........................................................................................

4. ............................................................................

5. ............................................................................

ආ. පහත සඳහන් ප්‍රශ්නවලට ''ඔව්'' හෝ ''නැත'' කියා ලියන්න.

1. මෙම පනත් සියල්ලම පැවැත්වූ බව තරුණයා කීවාද? ....................

2. මෙම තරුණයාට සම්පූර්ණවීමට වුවමනා නම් ඔහු සන්තක සියල්ල විකිණීමට යයි යේසුස්වහන්සේ කීසේක්ද?..........................................

3. ඔහුගේ මුදල් පොහොසත් අයට දීමට කීවාද? ..................................

4. උන්වහන්සේව අනුගමනය කිරීමට යේසුස්වහන්සේ මෙම පොහොසත් තරුණයාට කීසේක්ද?..........................................................................

5. මෙම තරුණයා යේසුස්වහන්සේව අනුගමනය කළාද?............................

6. මෙම තරුණයා නැවත යන්ට ගියේ ප්‍රීතියෙන්ද?..................................

# 18. එතුමට සිදුවීමට ඇති දෙය සිය ගෝලයින්ට යේසු කලින් පැවසූහ



(මතෙව් 20 : 17 - 19)

යේසුස්වහන්සේ යෙරුසලමට යන කළ ගෝළයන් දෙළොස් දෙනා වෙන්කර, මඟදී ඔවුන්ට කථාකර: අපි යෙරුසලමට යමුව; මනුෂ්‍යය පුත්‍රයා නායකයන්ටත් ලියන්නන්ටත් පාවාදෙනු ලබන්නේය. ඔවුහුද ඔහුව මරණයට නියමකර කවටකම් කිරීමටත්, තැලීමටත්, කුරුසියේ ඇණ ගැසීමටත්, අන්‍යය ජාතීන්ට පාවා දෙන්නෝය. නමුත් තුන්වනදා ඔහු නැගිටුවන ලබන්නේයයි කීසේක.

## ක්‍රිස්තුස්වහන්සේගේ මරණය අනතුරක් නොව

කෲර මිනිසුන් විසින් ක්‍රිස්තුස්වහන්සේව කුරුසියක් මත ඇණගසා මරණයට පත් කිරීමට පෙර උන්වහන්සේට කුමක් සිදුවේද යත් යේසුස්වහන්සේ ගෝලයන්ට කීහ. පාපයෙන් අප ගළවාගැනීම පිණිස උන්වහන්සේ කුරුසිය මත දිවි පිදීම උන්වහන්සේගේ සැලැස්මේ කොටසකි. යොහන් 3 : 14 - 15 මෙසේ අපට පවසයි: ''මෝසෙස් කාන්තාරයේ සර්පයා එසවූ ලෙසම, මනුෂ්‍යය පුත්‍රයාවද ඔසවන්නේය. උන්වහන්සේ කෙරෙහි අදහාගන්න, සැමදෙනම විනාශ නොවී සදකාල ජීවනය ලබන්නෝය.'' ක්‍රිස්තුස්වහන්සේ අප වෙනුවෙන් දිවි පිදූ නිසා අප ස්තුතිවන්ත විය යුතුයි. උන්වහන්සේ තරාතිරම් නොබලනසේක. අප කුමන පාටකට හෝ ජාතියකට හෝ කුලයකට හෝ තරාතිරමකට අයත් වූවත් කම් නැත. එතුමා සියල්ලන් උදෙසා මැරුණුසේක.
(2 කොරින්ති 5 : 15 කියවන්න.)


සැමදෙනම කියනුයේ විශ්වාස කරන ඔබ හෝ කවුරු හෝ වේවා ! යනුයි. ඔබ වෙනුවෙන් ඔබේ පාපයෙන් ඔබව ගළවාගැනීම පිණිස යේසුස් ක්‍රිස්තුස්වහන්සේ කුරුසිය මත මැරුණු බව විශ්වාස කළ කල්හි ඔබට සදකාල ජීවනය ලැබේ.

අ. ''දෙවියන්වහන්සේ සවකීය ඒකජාතක පුත්‍රයාණන් දෙන තරම් ලෝකයාට ප්‍රේම කළසේක.'' –යොහන් 3 : 16

# 19. ක්‍රිස්තුස්වහන්සේව අල්ලා ගන්නා ලදි

(මතෙව් 27 : 11 - 26)

යේසුස්වහන්සේ ආණ්ඩුකාරයා ඉදිරියෙහි සිටිසේක. නුඹ යුදෙව්වරුන්ගේ රජදැයි ආණ්ඩුකාරයා උන්වහන්සේගෙන් ඇසුවේය. එසේයයි උන්වහන්සේ කීසේක. නායක පූජකයන්ද වැඩිමහල්ලන්ද උන්වහන්සේට වරද තැබූ විට උන්වහන්සේ කිසි උත්තරයක් නොදුන්සේක. එවිට පිලාත් කථාකර: මොවුහු ඔබට විරුද්ධව කොපමණ දෙය ගැන සාක්ෂි කියන්නෝද කියා ඇසෙන්නේ නැද්දැයි කීවේය. නමුත් උන්වහන්සේ එක වචනයකින්වත් උත්තර නුදුන්සේක. එහෙයින් ආණ්ඩුකාරයා බොහෝ මවිත විය. මංගල්ලයෙහිදී සමූහයා ඉල්ලන එක් සිරකාරයකු ආණ්ඩුකාරයා විසින් නිදහස් කර දෙන සිරිතක් තිබුණේය. එකල බරබ්බස් නම් නමගිය සිරකරුවෙක් සිටියේය. එහෙයින් ඔවුන් රැස්වූ විට පිලාත් (ආණ්ඩුකාරයා) ඔවුන්ට කථාකර:



මා විසින් නුඹලාට කවරෙකු නිදහස් කර දෙනවාට කැමතිද? බරබ්බස්ද නැතහොත් ක්‍රිස්තුස් නම් යේසුස්දැයි ඇසුවේය. මක්නිසාද ඔවුන් ඊර්ෂ්‍යාවෙන් උන්වහන්සේව පාවා දුන් බව ඔහු දැන සිටියේය. තවද ඔහු විනිශ්චයාසනයෙහි සිටින විට ඔහුගේ භාර්යාව: ඒ ධර්මිෂ්ඨයාට කිසිවක් නොකරන්න. මම ඔහු නිසා සිහිනයකින් දුක් විදිමියි ඔහුට කියා එවීය. එහෙත් නායක පූජකයෝද, වැඩිමහල්ලෝද බරබ්බස් ඉල්ලන්ටත් යේසුස් වහන්සේ නසන්ටත් සමූහයන් කැමති කරවා ගත්තෝය. ආණ්ඩුකාරයා ඔවුන්ට උත්තර දෙමින්: මේ දෙදෙනාගෙන් කවරෙකු මා විසින් ඔබලාට නිදහස්කර දෙනවාට කැමතිදැයි ඔවුන්ගෙන් ඇසීය. බරබ්බස්යයි ඔවුහු කීහ. එසේවී නම් ක්‍රිස්තුස් යන යේසුස්ට මා විසින් කුමක් කරන්ටදැයි පිලාත් ඔවුන්ගෙන් ඇසීය. ඔහු කුරුසියේ ඇණගසනු ලබවයි සියල්ලෝම කීහ. එවිට ඔහු: මන්ද, මොහු මොන නපුරක් කළේදැයි ඇසුවේය. නමුත් ඔහු කුරුසියෙහි ඇණගසනු ලබවයි ඔවුහු අතිශයින් මොරදුන්හ. මෙසේ කෝළහාලයක් හට ගන්නවා මිස තම උත්සාහයෙන් කිසි පලක් නැති බව පිලාත් දැක, වතුර ගෙන සමූහයා ඉදිරියේ අත් සෝදමින්: මේ ධර්මිෂ්ඨයාගේ ලෙයින් මම නිදෙස් වෙමි, ඔබලාම බලාගත්වා යයි කීවේය. මුළු සෙනඟ උත්තර දෙමින්: ඔහුගේ ලෙය අප පිටද, අප දරුවන් පිටද වේවයි කීවෝය. එකල ඔහු බරබ්බස් ඔවුන්ට නිදහස් කර දුන්නේය. නමුත් ඔහු යේසුස්වහන්සේට තලා කුරුසියෙහි ඇණගැසීම පිණිස භාර දුන්නේය.

# ඔබ කළ යුතු දෙය

දහනව වන කථාන්තරයෙන් හිස්තැන් පුරවන්න.

1. නායක පූජකයන්ද, වැඩිමහල්ලන්ද, යේසුස්වහන්සේට වරද තැබූ කල්හි උන්වහන්සේ පිළිතුරු...............................................


2. මෙය ආණ්ඩුකාරයව............................................... මවිත කළේය.

3. බරබ්බස් නම ගිය.................. ..............................නමය.

4. මනුෂ්‍යයන්ට නිදහස්කර දුන්නේ කාවද?...................................

5. යේසුස්වහන්සේව..............................ලබවයි මිනිස්සු කීහ.

# 20. යේසුස්වහන්සේට කටු ඔටුන්නක් දෙන ලදි



(මතෙව් 27 : 27 – 30)

එවිට ආණ්ඩුකරුගේ භේවායෝ යේසුස්වහන්සේව රජ ගෙදර ශාලාවට ගෙන ගොස් මුළු භේවා කණ්ඩායම උන්වහන්සේ වෙතට රැස් කළෝය. ඔවුහු උන්වහන් සේගේ ඇඳුම් ගලවා, රතු සළුවක් උන්වහන්සේට ඇන්ද වූහ. ඔවුහු කටු ඔටුන්නක් ගොතා, උන්වහන් සේගේ හිසෙහි තබා බට දණ්ඩක් දකුණතටදී උන්වහන්සේ ඉදිරියෙහි දණ නමා ''යුදෙව්වරුන්ගේ රජ ශුභසිද්ධ වේවා'' කියා උන්වහන් සේට කවටකම් කළහ. ඔවුහු උන්වහන්සේට කෙළ ගසා බටදණ්ඩ ගෙන එතුමගේ හිසට පහර දුන්හ.

## ක්‍රිස්තුස්වහන්සේට සැළකූ ආකාරය

දුෂ්ට මිනිස්සු බොහෝ කෲර ලෙස යේසුස්වහන්සේට සැළකූහ. දුෂ්ටයන් දෙවියන්වහන්සේට ප්‍රේම නොකරන නිසා, සමහර විට අපටද ක්‍රිස්තුස් වහන්සේ වෙනුවෙන් දුක් විඳීමට සිදුවෙයි. යේසුස් ක්‍රිස්තුස්වහන්සේට ප්‍රේම නොකරන ඔවුහු, යහපත්වීමට සතුටු අයටද විරුද්ධ වෙති. යොහාන් 15 : 18–20 ඒ ගැන යේසුස්වහන්සේ අපට කියා ඇත: ''ලෝකයා නුඹලාට වෛර කරත් නම් නුඹලාට පළමුවෙන් මට වෛර කළ බව නුඹලා

දනිහුය. නුඹලා ලෝකයාට අයිති නම්, ලෝකයා ඔවුන්ගේ අයට ප්‍රේම කරන්නේය. නුමුත් නුඹලා ලෝකයාගේ නොවන නිසාත්, මා විසින් නුඹලා ලෝකයෙන් තෝරාගත් නිසාත්, ලෝකයා නුඹලාට වෛර වෙති. දසයෙක් තම ස්වාමියාට වඩා උතුම් නොවේයයි නුඹලාට මා කී වචන සිහිකරන්න. ඔවුහු මට පීඩා කළෝ නම් නුඹලාටත් පීඩා කරති මාගේ වචන රක්ෂා කළා නම් නුඹලාගේ වචනත් රක්ෂා කරන් නෝය.'' යොහන් 16 : 33 යේසුස්වහන්සේ ඉතා යහපත් රහසක් අප සමග බෙදා ගනිති: ''මා තුළ නුඹලාට සමාදනය තිබෙන පිණිස මේ දේවල් නුඹලාට කීවෙමි. ලෝකයෙහි නුඹලාට පීඩා තිබේ. නමුත් ධෛර්‍යයීමත් වෙන්න, මම ලෝකයෙන් ජය ගතිමි''යි කීසේක.

## ඔබ කළ යුතු දෙය

පහත සඳහන් ප්‍රශ්ණවලට පිළිතුරු විසිවන කථාන්තරයෙහි ඇත.

1. හේවායෝ යේසුස්වහන්සේගේ ඇඳුම් ගලවා උන්වහන්සේට රතු ........................................................ඇන්ද වූහ.

2. ඔවුහු ඔටුන්නක් ..........................ගොතා උන්වහන්සේගේ ....................................................දැමූහ.


3. ඔවුහු යේසුස්වහන්සේට කවටකම්කර නමස්කාර කරමින්, යුදෙව් වන්ගේ............................................ සුහසිද්ධ වේවායි කීහ.

4. ඔවුහු උන්වහන්සේට...........................ගසා උන්වහන්සේගේ හිසට..........................................පහර දුන්හ.

# 21. යේසුස්වහන්සේව මරුමුවට පත්කිරීම

(මතෙව් 27 : 31 - 38 සහ 50 - 54)

උන්වහන්සේට කවටකම් කළ පසු ඔවුහු රතු සළුව ගලවා උන්වහන්සේගේම ඇඳුම් අන්දවා කුරුසියෙහි ඇණගසනු පිණිස ගෙන ගියහ. ඔවුහු නික්ම යද්දී සීමොන් නම් කිරේනියේ මිනිසෙකු සම්භ වී උන්වහන්සේගේ කුරුසිය උසුලා ගෙන යෑමට ඔහුට බල කළෝය. ඔවුහු හිස්කබල යන අර්ථය ඇති ගොල්ගොතා නම් ස්ථානයට පැමිණ තිත්ත මිශ්‍ර කළ මුද්‍රිකපානය උන්වහන්සේට බොන්ට දුන්හ. උන්වහන්සේ රස බලා බීමට අකමැති වූසේක. උන්වහන්සේව කුරුසියෙහි ඇණගැසූ පසු ඔවුහු උන්වහන්සේගේ ඇඳුම් දදු දමා බෙද ගත්හ. ඔවුහු එහි සිට උන්වහන්-සේව රැකවල් කළෝය. තවද,




**මොහු යුදෙව්වන්ගේ රජ යේසුස්** කියා උන්වහන්සේට විරුද්ධව වරද ලියා උන්වහන්සේගේ හිසට උඩින් තැබුවෝය. එවිට සොරු දෙදෙනෙක්ද එක් අයෙකු දකුණු පසෙහිද තවකෙනෙකු වම් පසෙහිද උන්වහන්සේ සමග කුරුසියෙහි ඇණගසනු ලැබුවෝය. යේසු නැවතත් මහත් ශබ්දයකින් හඬ නගා ආත්මය භාර දුන්සේක. බලව දේව මාලිගාවේ තිරය, ඉහළ සිට පහළට දෙකට ඉරුණේය. පොළොව කම්පාවිය, පර්වත පැළුණේය. සොහොන් ගෙවල් ද ඇරුණේය. සැතපී සිටි නොයෙක් ශුද්ධවරයන්ගේ ශරීර නැගිටවනු ලදුව, ඔවුහු උන්වහන්සේ නැගිටුණු පසු සොහොන් ගෙවලින් නික්ම ශුද්ධ නුවරට ඇතුල්ව බොහෝ දෙනෙකුට පෙණුනෝය. සියයකට මුලාදෑනියාද, ඔහු සමග යේසුස් වහන්සේ රැකවල් කරමින් සිටි අයද පොළෝකම්පාවත්, සිදුවූ දෙයත් දැක ඉතා බියව: සැබවින් මෙතුමා දේව පුත්‍රයාමයි කීහ.

## ඒ කව්ද ?

1. යේසුස්වහන්සේගේ කුරුසිය රැගෙන යාම පිණිස බල කළේ කාටද?

.............................................................

2. දකුණු පසෙහිද, වම් පසෙහිද යේසුස්වහන්සේ සමග කුරුසියේ ඇණ ගසනු ලැබුවේ කවුරුද?.........................................

3. සියයකට මුලාදෑනියාද, ඔහු සමග යේසුස්වහන්සේ රැකවල් කරමින් සිටි අයද, පොළෝකම්පාවද, සිදුවූ දෙයද දුටු විට, යේසුස්වහන්සේ කවුරු කියා ඔවුහු කීවහුද?.........................................

# 22. යේසුස්වහන්සේව සොහොන් කිරීම



(මතෙව් 27 : 57 – 66)

සවස්වූ කළ යේසුස්වහන්සේගේ ගෝලයෙක්ව සිටි කෙනෙකු වන අරමාතියාවේ යෝසප්, පිලාත් වෙත ගොස්, යේසුස්වහන්සේගේ මෘත ශරීරය ඉල්ලීය. එවිට එය භාර දීමට පිලාත් අණ කළේය. යෝසප් මෘත ශරීරය ගෙන හණ රෙද්දකින් වෙලා ඔහු විසින් පර්වතයක කපා තිබූ ඔහුගේම සොහොන් ගෙයි තබා එහි දෙරකඩට විශාල ගලක් පෙරළා තබා ගියේය. මග්දලායේ මරියාද, අනික් මරියාද, සොහොන් ගෙය ඉදිරිපිට ඉඳගෙන සිටියහ.

පසුවද, එනම්, සූදනම් කිරීමේ දවසට පසුද නායක පූජකයෝද, ඵරිසිවරුද, පිලාත් ළඟට පැමිණ ස්වාමිනි, ඒ වංචාකාරයා ජීවත්ව සිටියදී මම තුන් දවසකට පසුව නැගිටින්නෙමියි කී බව අපට මතකය. එහෙයින් තුන්වෙනි දවස දක්වා අපට සොහොන් ගෙය ආරක්ෂා කිරීමට අණකළ මැනවි. නැතහොත්, සමහර විට ඔහුගේ ගෝලයන් පැමිණ ඔහු සොරාගෙන ගොස්, ඔහු මළවුන්ගෙන් නැගිටි බවට සෙනඟට කියනවා ඇත. මෙසේ පළමු මුළාවට වඩා අන්තිම මුළාව මහත්වන්නේයයි කීවෝය. නුඹලාට රැකවල්ලු සිටිති. නුඹලා ගොස් නුඹලාට පුළුවන් පමණ එය සුරක්ෂිතව තබා ගනිත්වායි පිලාත් ඔවුන්ට කීවේය. ඔවුහු ගොස් ගල මුද්‍රාකර රැකවලුන් ඇතුව සොහොන් ගෙය සුරක්ෂිත කළෝය.

## යේසුස්වහන්සේට යෝසප්ගේ ප්‍රේමය

පොහොසත් මිනිසෙකු වන යෝසප් යේසුස්වහන්සේට ප්‍රේමකර, ඔහු සතු අළුත් සොහොන් ගෙයෙහි උන්වහන්සේව තැන්පත් කළේය. ඔහුගේ මරණින් පසු ඔහුව තැන්පත් කරන පිණිස යෝසප් මෙය සාද තිබුණද, දැන් ඔහුගේ ප්‍රේමනීය ස්වාමීන්වහන්සේට මෙම විශේෂ විවේක ස්ථානය දීමට කැමති විය. යේසුස්වහන්සේ වෙත ඇති සැබෑ ප්‍රේමය පරාර්ථකාමිය. ප්‍රේමය සෑම මොහොතේදීම බෙදගනියි, ප්‍රේමය සේවය කිරීම පිණිස මාර්ගයක් සොයාගනියි. ඔබ යේසුස්වහන්සේට ආදරේද? උන්වහන්සේට සේවය කිරීම පිණිස ඔබ මාර්ගයක් සොයාගෙන තිබෙනවාද? ඔබ උන්වහන්සේ වෙනුවෙන් කුමක් කරනවාද?

# යේසුස්වහන්සේ සිය ජීවිතය පිදූහ

අපව පාපයෙන් ගළවන පිණිස යේසුස්වහන්සේ සිය කැමැත්තෙන්ම උන්වහන්සේගේ ජීවිතය පිදූහ. අප පාපයට වන්දි ගෙවීමට උන්වහන්සේගේ මරණය හා ශුද්ධ වූ ලෙය ගැලීම අවශ්‍යය විය. ලේ හැලීමෙන් මිස වෙන මගකින් පාපයට සමාව නැති බව හෙබ්‍රෙව් 9 : 22 පෙන්වා දෙයි. උන්වහන්සේට කිසිදු පාපයක් නැති නිසා යේසුස්වහන්සේ අප සම්පූර්ණ නිර්මල පූජාව වූහ. යොහන් 1 : 29 අපට මෙසේ කියයි: ''අන්න, ලෝකයේ පාපය දුරුකරන දෙවියන්වහන්සේගේ බැටළු පැටවාණෝ.'' අප පාපය දුරලන්ට වෙන කිසිවෙකුට කුරුසියක් මත මැරීමට බැරිය. තවද රන් රිදී වලට හෝ සතුන්ට හෝ සතුන් පූජා කිරීමෙන් හෝ පහන් පත්තු කිරීමෙන් හෝ රූපවලට මල් හා ආහාර ආදිය පූජා කිරීමෙන් හෝ දුප්පතුන්ට හෝ පූජකයන්ට දන දීමෙන් හෝ පාපයෙන් ගැළවීමට බැරිය. 1 පේතෘස් 1:18,19 මෙසේ කියයි: ''මක්නිසාද නුඹලාගේ පියවරුන්ගෙන් ලැබූ නිෂ්ඵල හැසිරීමෙන් නුඹලා මුදනු ලැබුවේ රන් රිදී වැනි දිරායන දෙයින් නොව; නුමුත් කැලලක්වත්, පලුද්දක්වත් නැති, බැටළු පැටවකුගේ ලේ වැනිවූ ක්‍රිස්තුස්වහන්සේගේ අනර්ඝ ලෙය තුළින් බව නුඹලා දනිහුය.''

යේසුස්වහන්සේ තම කැමැත්තෙන්ම උන්වහන්සේගේ ජීවිතය පිදූ බව අප දන්නේ කෙසේද? යොහන් 10 : 18 මෙසේ කියයි: කිසිවෙකු එය මාගෙන් උදුරා ගන්නවා නොව මමම පුදමි. එය පිදීමට මට බලය තිබේ. නැවතත් එය ගැනීමටද මට බලය තිබේ. **යේසුට සියලු බලය ඇත.** මතෙව් 28 : 18 කියවන්න.

යේසුස්වහන්සේ පිලාත් ඉදිරිපිට, කුරුසියෙහි ඇණගසනු පිණිස සිටගෙන සිටි විට, උන්වහන්සේව කුරුසිය මත ඇණගැසීමට හෝ නිදහස් කිරීමට ඔහුට බලය ඇත කියා පිලාත් සිතීය. නුමුත් යොහන් 19 : 11 යේසුස්ගේ වචන දෙය බලන්න– යේසුස්වහන්සේ උත්තර දෙමින්: ''ඉහළින් එය ඔබට නොදෙන ලද නම් මට විරුද්ධව ඔබට කිසි බලයක් නැත.''

සෑම ජාතියක් උදෙසාම යේසුස්වහන්සේ සිය ජීවිතය පිදූහ. එමනිසා සෑම ජාතින්ගෙන්ම කොටසක් යේසුස්වහන්සේව විශ්වාස කර ගැළවීම ලැබගනිති. **ඔබත් ස්වාමි වූ යේසුස්වහන්සේව විශ්වාස කරන** කෙනෙකු වෙන්න! එළිදරව් 5 : 9, 10 මෙසේ කියයි– ඔවුහු අළුත් ගීතිකාවක් ගායනා කරමින්: ඔබ පොත ගැනීමටත්, එහි මුද්‍රාව කැඩීමටත් වටිනා තැනැන්වහන්සේය. මක්නිසාද ඔබ මරනු ලැබ, සියලු ගෝත්‍රවලින්ද භාෂාවන්ගෙන්ද සෙනඟගෙන්ද ජාතින්ගෙන්ද මනුෂ්‍යයන් ඔබ ලෙයින් මිලයට ගෙන ඔවුන් අපගේ දෙවියන්වහන්සේට රාජ්‍යයක්ද, පූජකයන්ද කළසේක. ඔවුහු පොළොවෙහි රජකම් කරතියි කීහ.

# යේසුස්වහන්සේගේ සතුරෝ උන්වහන්සේව සොහොනේ තැබීමට වෑයම් කරති

කිසි කෙනෙකුට යේසුස්වහන්සේගේ මෘත ශරීරය සොරකම් කිරීමට බැරි වන පිණිස ඉතා තදින් සොහොනේ දෙර වසා දැමීම පිණිස යේසුස්වහන් සේගේ සතුරන් වන නායක පූජකයන්ද, පරිසීන්ද වග බලා ගත්හ. තවද සොහොන් ගෙය ආරක්ෂා කිරීමට ආරක්ෂක භටයන්ද එහි සිටවූහ. උන්වහන්සේගේ මෘත ශරීරය කිසිම විදියකට සොරකම් කිරීමට බැරි පරිදි ආරක්ෂා කළ නිසා, එය යේසුස්වහන්සේගේ නැවත නැගිටීම තවත් පුදුමාකාර එකක් කළේය. දැන් සිදුවීමට ඇති හාස්කම අපි 23 වන කථාන්තරයෙන් කියවමු.

## පිළිස්සුණු දෑත

''ඇයි කල්වාරිය භුක්ති විඳින්නේ'' –එය අස්වාභාවික දෙයක් ලෙසත් ඒ ගැන සිතන විටත් ඉතා බියට පත්වන පුද්ගලයෙක් මගෙන් ඇසිය. තවද ඔහු: කල්පනාකර බලන්න, මිනිසෙක් ඉතා භයංකාර, කෲර මරණයකට පත් වූයේ නම්, එය තමා, රෝමයේ කුරුසියේ ඇණ ගැසීම. කුරුසිය බිම තබා, එම තැනැත්තාව එය මත දිගහැර නොවැටී එල්ලී සිටීම පිණිස අත් හා පාවලට විශාල ඇණ ගසයි, ඉන්පසු කුරුසිය ගෙන එයට පිළියෙල කර ඇති බිළයකට දමා එම ඇණගැසූ පුද්ගලයා මැරෙන තෙක් එහි එල්ලා තබයි. රාත්‍රී භෝජනය කියා ක්‍රිස්තියානින් භුක්ති විඳින්නේ මෙයයි. මා ඔබට කියන්නම්, මෙය අස්වාභාවික ඉතා භයංකාර කෲර දෙයක්. මෙය කෙසේ විස්තර කරන්ටද කියා මා නම් දන්නේ නැතයි කීය. ''මිත්‍රය ඔබ ඒ සිදුවීම ගැන සිතන්නේ එය කුමක් සඳහාද කියා නොසිතයි. තවද ඔබ ඒ මැරුණු පුද්ගලයාව හරිහැටි එයත් සමග සසඳා නැහැ. මා ඔබට දැන් පුංචි කථාන්තරයක් කියන්නම්'' මම ඔහුට කීවෙමි.

එක් රුවැති ස්ත්‍රියක් සිටියා. ඇයගේ දෑතම ඉතා භයානක ලෙස පිළිස්සී තිබුණා. අවුරුදු ගණනක් තිස්සේම, ඇගේ කුඩා දියණිය තම මවගේ අත් ඉතා පිළිකුල් ලෙස කොරවී තිබෙන්නේ ඇයිදැයි සිතමින් සිටියා. ඇය ඒ අත්දෙක දිහා බැලුවේත් ලොකු පිළිකුලකින්. නුමුත් එක් දිනක් ඈ ඇගේ අම්මගෙන් මෙසේ ඇසුවා: ''අම්මේ මම අම්මගේ මුහුණටයි, ඇස්වලටයි, කොණ්ඩෙටයි ගොඩාක් ආදරෙයි. ඒවා හරිම ලස්සණයි. නුමුත් අම්මගේ අත් නම් හරිම කැතයි. මට ඒවා දිහා බලන්නවත් බැහැ, එපමණටම පිළිකුල්. ඇයි ඒවා මෙහෙම පිච්චිලා කොරවෙලා තියෙන්නේ? එවිට ඒ අම්මා දුවට මෙසේ කීවා: හොඳයි මගේ දුවේ, එහෙනම් අහගන්න, මගේ අත් ගැන මා දුට කියන්නම්. ඇත්තෙන්ම මම නම් හිතුවේ මේ ගැන කවදාවත් කියන්නේ නැතුව ඉන්නයි; නමුත් මෙය දැන් දුව දැනගන්නවා නම් වඩා හොඳයි.

මෙය සිදුවුයේ අවුරුදු දහයකට පමණ ඉහතයි. එවිට දූව තුන් මසක් පමණැති කුඩා දරුවෙක්. දැන් වගේම ඒ කාලෙත් දූට මම කොපමණ ආදරේද! ඉතින් දූවේ, එද උදේ මට හුඟක් වැඩ තිබුණා. දූවට කවා පොවා ටිකක් වැඩිය නිදගන්න කියලා දූවව තොටිල්ලේ තබා මම කුස්සියේ වැඩ වගයක් කරන්න ගියා. නුමුත් මගේ කන් තිබුණේ දූවගේ දිහාවට හරවලයි. මම හුඟ වෙලාවක් කුස්සියේ හිටියේ නැහැ. ඒත් මම හිතුවට වඩා පමාවුණා. එකපාරටම මට ශබ්දයක් ඇසිලා එළිය බැලුවා. ගින්නක්! ගින්නක්! කියා අසල්වාසින් අපේ ගේ දිහාවට දුවගෙන එනවා දැක්කා. මම කෑම කන කාමරයටද, ඉන්පසු සාලයටද, වේගයෙන් දුව ගියා. මා දැක්කා ඔබ සිටි කාමරයට ඇතුල්වන දොරද, සොල්දරයට යන පඩි පේළියද, ඉතා භයානක ලෙස ගිනි ගන්නවා. මට උදව්වට අසල්වාසීන් ආවා. මාව ගල් ගැහිලා මගේ කටත් වැහිලා කථා කරගන්න බැරුව හිටියා. පඩි පේළිය අසළ ලොකු තුවායක් තිබුණා. එයින් මගේ ඔළුවද, උරහිස්ද වසාගෙන ඒ ගින්දර තුළින් දුවලා ඔබ සිටි කාමරයේ දොර ඇරලා දූවව ඒ තොටිල්ලෙන් අරගෙන ඇඳේ තබුණු රෙදිවලින් ඔතාගෙන, මගේ පපුවට තද කරගෙන ගෙයින් එළියට දිව්වා. මගේ ඔළුවත්, මුහුණත්, උරහිසත් බේරුණා. නුමුත් කටුවලින් මස් වැටෙන තෙක්ම මගේ අත් දෙක පිච්චුනා. දූවේ මෙය තමයි මගේ මේ කැත අත් දෙකේ කථාව.''

දැන් මේ කුඩා ළමයා ගැන ඔබ කුමක්ද සිතන්නේ? ඇය පොඩි ළමයෙක්, කිසිම අස්වාභාවික දෙයක් ඈ තුළ තිබුණේ නැහැ. ඇය එක්වීටම ඇගේ මවගේ අත් දෙකම අල්ලා ගෙන, ඇගේ පුංචි ඇඟිලිවලින් ඒ අත් පිරිමැද ඒ සියුම් පුංචි දෙතොලින් ඒ දෑත සිප ගත්තා. ඉන්පසු තම අම්මා දෙස බලා: ''අනේ අම්මේ, මම අම්මාගේ ලස්සණ මුහුණට ආදරෙයි; ඔබේ ඇස්වලටත් ආදරෙයි, උරහිසටත් ආදරෙයි, කොණ්ඩෙටත් ආදරෙයි. නුමුත් ඔක්කෝටම වඩා අම්මගේ මේ ආදරවන්ත අත්වලට ආදරෙයි'' කියා කීවා. ඉතින් මිත්‍රය, කල්වරියේ යේසුස්වහන්සේගේ මරණය ගැනද මේ විධියටම සිතිය යුතුයි.''

## දෙවියන්වහන්සේ වෙත සේවය

1. සමාව ලැබෙන පිණිස අප පව් යේසුස්වහන්සේට කියා දිය යුතුයි. (1 යොහන් 1 : 9)
2. ගැළවීම ලැබෙන පිණිස යේසුස්වහන්සේව විශ්වාස කළ යුතුයි. (ක්‍රියා 16 : 31)
3. අප මුළු සිතින්ද, ආත්මයෙන්ද, බුද්ධියෙන්ද දෙවියන්වහන්සේට ප්‍රේම කළ යුතුයි. (මතෙව් 22 : 37)
4, අප දෙවියන්වහන්ගේ පුත්‍ර ක්‍රිස්තුස්වහන්සේ ගැන මිනිසුන් ඉදිරියේ සාක්ෂි දැරිය යුතුයි. (මතෙව් 10 : 32)
5. දෙවියන්වහන්සේට ප්‍රසන්නව අප හැසිරිය යුතුයි. (1 තෙසලෝනික 4 : 1)

# 23. යේසුස්වහන්සේ මළවුන්ගෙන් නැගිටිසේක



(මතෙව් 28:1–10)

සබත් දවස නිමවෙන්නට ආසන්නව, සතියේ පළමුවන දින එළිවෙන වේලේ මග්දලායේ මරියාද, අනිත් මරියාද සොහොන් ගෙය බැලීමට ගියහ. එවිට මහත් භූමිකම්පාවක් ඇතිවිය. මක්නිසාද ස්වාමින්වහන්සේගේ දූතයෙක් ස්වර්ගයෙන් බැස ගල අහකට පෙරළා එය පිට හිඳ ගත්තේය. ඔහුගේ පෙනීම විදුලිය මෙන් විය ; ඔහුගේ වස්ත්‍ර හිම මෙන් සුදුව තිබුණේය. රැකවල්ලු ඔහුට හයේ වෙව්ලා මළවුන් මෙන් වූහ. දේව දූතයා එම ස්ත්‍රීන්ට කථා කරමින්: හය නොවන්න ! කුරුසියෙහි ඇණ ගසනු ලැබූ යේසුස්වහන්සේව ඔබලා සොයන බව දනිමි. උන් වහන්සේ මෙහි නැත. උන් වහන්සේ කී ලෙසට නැගිට්ට සේක. එන්න, උන්වහන්සේ සිටි ස්ථානය බලා විගස ගොස්, උන්වහන්සේ මළවුන්ගෙන් නැගිට්ට බව උන්වහන්සේගේ ගෝලයන්ට කියන්න. උන් වහන්සේ ඔබලාට ප්‍රථම ගලීලයට යනසේක. එහි දී ඔබලා උන් වහන්සේ දකින්නහුය. බලව, මම ඔබලාට කීවෙමි. එවිට ඔවුහු හයින්ද, මහත් ප්‍රීතියෙන්ද සොහොන් ගෙයින් නික්ම ගොස් උන්වහන්සේගේ ගෝලයන්ට දන්වන පිණිස දුව ගියෝය. එකල යේසුස්වහන්සේ ඔවුන්ට සම්භවී : සුබසිද්ධ වේවායි කීසේක. ඔවුහු ළඟට පැමිණ එතුමාගේ පාද වැළඳ උන්වහන්සේට නමස්කාර කළෝය. එකල යේසුස්වහන්සේ ඔවුන්ට කථාකර: හය නොවන්න, මාගේ සහෝදරයන් වෙත ගොස්, ගලීලයට පිටත්වන්න කියා ඔවුන්ට කියන්න. එහිදී ඔවුන් මා දකිනවා ඇතැයි කීසේක.

## ඔබ කළ යුතු දෙය


23 වන කථාන්තරය කියවා හිස්තැන් පුරවන්න.

1. ස්වාමින්වහන්සේගේ දූතයා ස්වර්ගයෙන් පැමිණ..............පෙරළා දැමිය. ඔහුගේ වස්ත්‍ර...........................මෙන් සුදුව තිබුණේය.

2. රැකවල්ලු බියෙන් වෙව්ලා.................................මෙන් වූහ.

අප නැවතත් ජීවත් වන පිණිස මරණයෙන්ද, අපායෙන්ද, මිනී වලෙන්ද **යේසුස්වහන්සේ ජයගත්හ.** යොහන් 14 : 19 උන්වහන්සේ මෙසේ කියති: ''මා ජීවත් වන නිසා ඔබත් ජීවත් වන්නේය.'' තවද යොහන් 11 : 25 – 26 උන්වහන්සේ මෙසේ කියති: ''නැවත නැගිටීමද, ජීවනයද මමය. මා කෙරෙහි අදහාගන්නා මළ නමුත් ජීවත් වන්නේය. ජීවත් වන කවුරු නමුත් මා කෙරෙහි අදහන්නේද, ඔහු කිසි කලක නසින්නේ නැත.''

## 24. යේසුස්වහන්සේගේ අන්තිම වචන



(මතෙව් 28:16-20)

ගෝලයෝ එකොළොස් දෙනා

යේසුස්වහන්සේ තමන්ට නියම කළ ගලීලයේ කන්දට ගියෝය. ඔවුහු උන්වහන්සේ දැක උන්වහන්සේට නමස්කාර කළෝය. නමුත් සමහරෙක් සැක කළෝය. යේසුස් වහන්සේ ඔවුන් ළඟට පැමිණ කථා කර : ස්වර්ගයේද, පොළොවේද සියලු බලය මට දී තිබේ. එබැවින් ඔබලා ගොස් සියලු ජාතීන් ගෝලයන් කරන්න. පියාණන්ගේත්, පුත්‍රයාණන්ගේත්, ශුද්ධාත්මයාණන්ගේත් නාමයට ඔවුන් බෞතීස්ම කරන්න. මා විසින් ඔබලාට අණ කළ සියල්ලම පවත්වන්ට ඔවුන්ට උගන්වන්න. මමද ලෝක අන්තිමය දක්වා සැම කල්හිම ඔබලා සමග සිටිමියි කීසේක. ආමෙන්.

අප හිතැති මිතුරෙක් මරණාසන්නව සිටි කල ඔහුගේ අන්තිම කැමැත්ත හා ඉල්ලීම ඉෂ්ඨ කිරීමට අපි බොහෝ උනන්දු වෙන්නෙමු. එම අන්තිම වචන අප මතකයේ රැඳී තිබෙයි. එමෙන්ම මරණාසන්නව සිටින පුද්ගලයද අප හැර යාමට පෙර පැවසූ එම අන්තිම වචන ද අපට ඉතා වැදගත් වෙයි. අප ගැළවුම්කරු යේසුස්වහන්සේගේ අනිත් අන්තිම වචන නම්: ''නුඹලා ලොව මුළුල්ලේ ගොස් සකල ජනතාවට ශුභාරංචිය ප්‍රකාශ කරන්න'' යනුයි. (මාර්ක් 16 : 15) යේසුස්වහන්සේගේ මෙම අන්තිම වචන ඉෂ්ඨ කිරීමට ඔබ මුළු වීරිය යොදනවාද?

## ඇයි අප අන්‍යයන්ට කිව යුතු?

ක්‍රියා 4 : 12 මෙසේ කියයි: "වෙන කිසිවෙකු තුළ ගැළවීම නැත. මක්නිසාද අපේ ගැළවීමට අවශ්‍යය වෙන කිසි නාමයක් ස්වර්ගයෙන් යට මිනිසුන් අතරේ නැත්තේය." සදකාල ජීවනයට එකම **බලාපොරොත්තුව** යේසුස්වහන්සේ බව මෙයින් අපට පෙනෙයි.

යොහන් 14 : 6 මෙසේ පවසයි: "යේසුස්හෙන්සේ ඔහුට කියනසේක්: මාර්ගයද, ජීවනයද, සැබෑවද, මමය. මා තුළින් මිස, පියාණන්වහන්සේ වෙත කිසිවෙක් පැමිණෙන්නේ නැත." **පියාණන්වහන්සේ** වෙත ඇති එකම **මාර්ගය, යේසුස්වහන්සේ** බව මෙහිදී නැවතත් අපට පැහැදිලිව පෙනෙයි.

## ක්‍රිස්තුස්වහන්සේගේ සැබෑ අනුගාමිකයාගේ පරීක්ෂණය

යේසුස්වහන්සේ: "ඔබලා මට ප්‍රේම කරත් නම් මාගේ පනත් රක්ෂා කරන්න" (යොහන් 14 : 15). දෙවියන්වහන්සේ වෙත අපගේ යුතුකම් ඉෂ්ඨ කිරීමේ පළමු හා උත්තම පනත මතෙව් 22 : 37 තිබේ. එනම්, "ඔබගේ මුළු හෘදයෙන්ද, ඔබගේ මුළු ආත්මයෙන්ද, ඔබගේ මුළු බුද්ධියෙන්ද ඔබගේ දෙවිවූ ස්වාමින්වහන්සේට ප්‍රේම කරන්න." සියලු මිනිසා වෙත අපගේ යුතුකම් ඉෂ්ඨ කිරීමට, දෙවන උත්තම පනත පෙන්වයි. එය මතෙව් 22 : 39 ඇත. එනම්, "ඔබට මෙන් ඔබේ අසල්වැසියාට ප්‍රේම කරන්න." මෙම පනත් දෙක මත ව්‍යාවස්ථාවත්, අනාගත වාක්‍යයත් පිහිටා තිබේ (මතෙව් 22 : 40).

# 25. යේසුස්වහන්සේ නැවත පැමිණෙති

## උන්වහන්සේගේ නැවත ඊමේ ලකුණු මොනවාද?

උන්වහන්සේගේ නැවත පැමිණීම ගැන සම්පූර්ණයෙන් දැනගැනීමට නම් මතෙව් 24 වන පරිච්ඡේදය සම්පූර්ණයෙන් කියවන්න.
**ඉන් සමහරක්:**

1. මම ක්‍රිස්තුස් කියා පැමිණෙන නොයෙක් අන්ත ක්‍රිස්තුස්ලා බොහෝ දෙනෙකුව මුළා කරති. අප ඔවුන් අනුගමනය කළ නොයුතුයි. (පද 5, 23, 24 සහ 25)

2. යුධ හා යුධ ආරංචි, ජාතියක් ජාතියකට විරුද්ධවද, රාජ්‍යයක්

රාජ්‍යයකට විරුද්ධවද නැඟිටින්නේය. (පදය 7)

3. බොහෝ ස්ථානවල සාගත, පීඩන සහ භූමිකම්පා ඇති වෙයි. මේවා දුක් ගාවිනාවල පටන්ගැන්ම පමණය. (පද 7 - 8)

4. යේසුස්වහන්සේගේ නාමය දරණ බැවින් කිතුබැතියන්ට පීඩා කර මරා දමති. සියලු ජාතීන් ඔවුන්ට වෛර කරති. (පදය 9). අපට සදකාල ජීවනය දෙන පිණිස ක්‍රිස්තුස්වහන්සේ පැමිණ අප වෙනුවෙන් දුක් විදිසේක. දැන් උන්වහන්සේට අප ප්‍රේමය ඔප්පු කරන පිණිස අපට උන්වහන්සේ වෙනුවෙන් දුක් විදීමට අවස්ථාවක් ලැබී ඇත.

5. නමුත් බොහෝ ක්‍රිස්තියානින් බාධා වී, ක්‍රිස්තුස්වහන්සේව අත්හරිති. ඔවුන් එකිනෙකා ගැන කියමින්, පාවාදෙමින්, එකිනෙකාට වෛර කරති. (පදය 10)

6. බොහෝ බොරු අනාගතවක්තෘන් පැමිණ බොහෝ දෙනෙක් රවටති. උතුම් වූ ක්‍රිස්තියානින්වද රැවටීම පිණිස ඔවුහු බොහෝ පුදුම හාස්කම් කරති. (පදය 11 සහ 24)

7. නෝවාගේ දවස් මෙන්, කමින්, බොමින් සරණ පාවා ගනිමින්, සරණ පාවා දෙමින් ජීවත් වෙති. (පද 37 - 39)

8. තවද, පීඩා පසුවු කෙනෙහිම, ඉර අඳුරුවන්නේය. සඳ එළිය නොදෙන්නේය, තාරකා අහසෙන් වැටෙන්නේය, අහසේ බලපරාක්‍රමද සෙලවෙන්නේය. (පදය 29)

## උන්වහන්සේ කෙසේ පැමිණෙත්ද?

1. බලාපොරොත්තු නොවූ වෙලාවක උන්වහන්සේ පැමිණෙති. මතෙව් 24 : 27 මෙසේ කියයි: ''යම් සේ විදුලිය පෙරදිගින් නික්ම අපරදිග දක්වා පෙනේද, මනුෂ්‍යය පුත්‍රයාගේ ඊමද එලෙසම වන්නේය.

2. මහත් බලයෙන්ද, තේජසින්ද. උන්වහන්සේ අහසේ වලාකුල් පිට එති. මතෙව් 24 : 30 එය අපට කියා දෙයි.

3. ...සෑම ඇසක්ම උන්වහන්සේව දකින්නේය. (එළිදරව් 1 : 7)

4. ''ස්වාමින්වහන්සේ උත්තම දේව දූතයාගේ හඬ තුළින් හා දෙවියන් වහන්සේගේ හොරණෑ හඬින්, මහත් ශබ්දයක් නඟමින් ස්වර්ගයෙන් බැස එනසේක. ක්‍රිස්තුස්වහන්සේ තුළ මළ අය පළමුව නැඟිටින්නේය. ඉන්පසු ජීවත්ව ඉතිරිව සිටින අප එකවිටම ඔවුන් සමග ස්වාමින්වහන්සේ සම්භවන පිණිස වළාකුල්වලින් අහසට ඇදගනු ලබන්නේය. මෙසේ අපි සදකාලයටම උන්වහන්සේ සමග සිටින්නෙමුව. එමනිසා මෙම වචනවලින් එකිනෙකා සනසාගන්න.'' (1 තෙසලෝනික 4 : 16 - 18)


5. ................................ නුඹලා කෙරෙන් ස්වර්ගයට ඔසවාගනු ලැබූ මෙම යේසුස්වහන්සේ ස්වර්ගයට යනවා නුඹලා දුටු ආකාරයෙන්ම නැවතත් පැමිණෙන්නේය.'' (ක්‍රියා 1 : 11)

## යේසුස්වහන්සේගේ ඊමට සූදානම් වන්නේ කෙසේද?

උන්වහන්සේ ආලෝකයේ සිටින ලෙස අපද ආලෝකයේ සිටිත් නම් අපට එකිනෙකා සමග සහභාගිකම් ඇත. උන්වහන්සේගේ පුත්‍ර යේසුස් ක්‍රිස්තුස්වහන්සේගේ ලේය අපව සියලු පාපයෙන් පවිත්‍ර කරයි. (1 යොහොන් 1 : 7)

## ස්වර්ගයට යෑමට ඔබ කැමතිද?

ස්ථිර මග යන මේ ළමයව පාට කරන්න.




ගීතාවලිය 86 : 5– ''ස්වාමීන්වහන්ස ඔබ යහපත්ය, කමාවෙන්ට සූදානම්ය; ඔබට යාඥා කරන සියල්ලන්ටම ඔබ බොහෝ කරුණාවන්තය.


යොහන් 14 : 6– ''යේසුස්වහන්සේ තෝමස්ට මෙසේ කීසේක: මාර්ගයද, සැබෑවද ජීවනයද මමය. මා තුළින් මිස, පියාණන්වහන්සේ වෙත කිසිවෙක් පැමිණෙන්නේ නැත.

# එහි යන්නේ කෙසේද?

පළමුව:

## ඔබේ සෑම පාපයකටම දුක් වෙන්න

එක් කුඩා දැරියක් මෙසේ කීවාය: ''පාපයට දුක් වෙනවා කියන්නේ, එය සම්පූර්ණයෙන්ම අත්හැරීම පිණිස දුක්වීමය.''



මිනිසාව පාපයට බැඳ තැබීම පිණිස යක්ෂයා නරක පුරුදු ගෙන එයි.

අපට නිදහස්වීමට බැරි ලෙස ඔහු අපව දම්වැල්වලින් බඳියි.

දම්වැල්ද, සියල්ලද, **යේසුස්වහන්සේ** වෙත එන්න. ඔබව නිදහස් කිරීමට **උන්වහන්සේට** පුළුවන.


දෙවනුව;

## පසුතැවිලි වී දෙවියන්වහන්සේට පව් කියා දෙන්න

1 යොහන් 1 : 9 ''අපේ පව් අපි කියා දෙමු නම්, අපේ පව් අපට කමා කරන්ටත්, සියලු අධර්මිෂ්ඨකමින් අප පවිත්‍ර කරන්ටත් උන්වහන්සේ විශ්වාසව, ධර්මිෂ්ඨව සිටිනසේක.

## යේසුස්වහන්සේට සියල්ල කියන්න
## එතුමා ඔබේ යාඥාව අසති

පාපයේ දම්වැල් බිඳලෑමට හැකි කාටද යන්න බැලීමට තිත් උඩින් අඳින්න.



තෙවනුව:

## එතුමාව විශ්වාසකර ඔබ සිතට හා ජීවිතයට එතුමාව පිළිගන්න

ඔබ හදෙහි දොර විවෘතකර, යේසුස්වහන්සේට ඔබ හද තුළට ඒමට **දැන්ම** ඉඩ දෙන්න !! එළිදරව් 3 : 20 ''මෙන්න මම දොර ළඟ සිට තට්ටු කරමි. යමෙක් මාගේ හඬ අසා දොර අරියි නම්, මම ඔහු වෙත එන්නෙමි.''

අප සැබෑ ලෙස පසුතැවිලි වී විශ්වාස කළ විට, අප එතුමට අයිති බවට ස්ථිර විශ්වාසයක් ඇති වෙයි.

රෝම 8 : 16 ''අප දෙවියන්වහන්සේගේ දරුවන් බව ආත්මයාණන් වහන්සේ අප ආත්මය සමග එක්ව සාක්ෂි දරති.

## ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ ඔබේ ගැළවුම්කරු මෙන් ඔබ විශ්වාස කළාද?

## දෙවියන්වහන්සේගේ වචනය ඉෂ්ට කිරීම

1. අප පාපයට පසුතැවිලි වූ **පසු** හා

2. ස්වාමි වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව **අප ගැලවුම්කරු** මෙන් විශ්වාස කළ **පසු,**

3. **එවිට – අප දේව වචනය ඉෂ්ට කළ යුතුයි.**

අප ආලෝකයේ ඇවිදිමින් **එදිනෙද** ජීවිතයේදී යේසුස්වහන්සේව අනුගමනය කළ යුතුයි. 1 යොහන් 1 : 7 මෙසේය: ''උන්වහන්සේ ආලෝකයෙහි සිටින ලෙස අපද ආලෝකයෙහි සිටිත් නම් අපට එකිනෙකා සමග සහභාගිකම් ඇත. උන්වහන්සේගේ පුත්‍ර යේසුස්වහන්සේගේ ලෙය අපව සියලු පාපවලින් පවිත්‍ර කරයි.

සිව්වෙනුව:

## දිනපතා ක්‍රිස්තුස්වහන්සේ උදෙසා ජීවත්වෙන්න

යොහන් 8 : 31 මෙසේ කියයි: ......................නුඹලා මාගේ **වචනයෙහි පවතිනවා නම් එවිට සැබවින්ම නුඹලා මාගේ ගෝලයන්ය.** නුඹලා සැබෑව දැනගනිති; සැබෑව නුඹලාව නිදහස් කරති. (32 වන පදය)

## දිනපතා දෙවියන්වහන්සේට යාඥා කිරීමෙන් ඔබව ශක්තිමත් වෙයි

## ඔබ කළ යුතු දෙය

අප දෙවියන්වහන්සේ වෙනුවෙන් ශක්තිමත්ව වැඩීමට කුමක් කළ යුතුදැයි පෙන්විමෙහිලා මෙම යාඥා කරන දෑත් පාට කරන්න.




## දිනපතා දේව වචනය කියවන්න

උන්වහන්සේගේ වචනය ඔබ සිතේ තැන්පත් කරගන්න. හැකිතරම් පද කටපාඩම් කරන්න.

# ඔබ ක්‍රිස්තුස්වහන්සේව ඔබේ ගැළවුම්කරු ලෙස පිළිගත්තද?

එසේ නම්, මෙම සිතෙහි ඇඳ ඇති ඉරි මත ඔබ නම ලියන්න.



යේසුස්වහන්සේ ගැන හා උන්වහන්සේ ඔබට කළ දෙය ගැන අන්‍යයන්ට පවසන්න.

# අප දැනගත යුතු කාරණා

## දෙවියන්වහන්සේ අප ලොව මැවූසේක



උත්පත්ති 1:1-25

පටන්ගැන්මේදී දෙවියන්වහන්සේ අහසත්, පොළොවත් මැවූසේක. පොළොව පාලුව, හිස්ව තිබුණේය. ගැඹුර පිට අන්ධකාරය විය. දෙවියන්වහන්සේගේ ආත්මය ජලය මත හැසිරෙමින් සිටිසේක. ආලෝකය වේවා කියා දෙවියන්වහන්සේ කීසේක. එවිට ආලෝකය ඇති විය. ආලෝකය යහපත් බව දෙවියන්වහන්සේ දුටුහ. දෙවියන්වහන්සේ අන්ධකාරයෙන් ආලෝකය වෙන් කර, ආලෝකයට දවාලද, අන්ධකාරයට රාත්‍රියද කියා නම් කළහ. සවස විය, උදය විය. එය පළමු දවසය. ජල මධ්‍යයෙහි අවකාශයක් වේවා. එය තුළින් ජලය ජලයෙන් වෙන් වේවා කියා දෙවියන්වහන්සේ කීසේක. දෙවියන්වහන්සේ අවකාශයක් සාද, අවකාශයට ඉහළින් තිබූ ජලය අවකාශයට පහළින් තිබූ ජලයෙන් වෙන් කළහ. එය එසේ විය. අවකාශයට අහස කියා නම් කළසේක. සවස විය, උදය විය. එය දෙවන දවසය. අහසට පහළින් ඇති ජලය එක් ස්ථානයකට රැස් වී, වියළි භූමිය පෙනේවා කියා දෙවියන්වහන්සේ කීසේක. එය එසේ විය. වියළි භූමියට පොළොව කියාද රැස්වූ ජලයට මුහුද කියාද, දෙවියන්වහන්සේ නම් කළහ. එය යහපත් බව දෙවියන්වහන්සේ දුටුහ. තෘණද, බීජ උපදවන පලාද, එම වර්ගයේ ඵල දරන බීජ සහිත පලතුරු ගස් ද පොළොව මත හටගත්වා කියා දෙවියන්වහන්සේ කීසේක. එය එසේ විය. තෘණද, ඒ ඒ වර්ගයේ බීජ උපදවන පලාද ඒ ඒ වර්ගයේ බීජ සහිත ඵල දරන පලතුරු ගස්ද පොළොවෙන් හට ගත්තේය. එය යහපත් බව දෙවියන්වහන්සේ දුටුසේක. සවස විය, උදය විය. එය තෙවන දවසය. රාත්‍රියෙන් දවාල වෙන් කිරීමට අහසෙහි ආලෝකයන් වේවා; ඒවා ලකුණු පිණිස ද, සෘතු පිණිසද, අවුරුදු පිණිසද වේවා ; පොළොවට ආලෝකය දීමට ඒවා අහසෙහි ආලෝකයන් පිණිස වේවා කියා දෙවියන්වහන්සේ කීසේක. එය එසේ විය. දෙවියන්වහන්සේ මහත්

ආලෝක දෙක සෑදූහ. වඩා මහත් ආලෝකය දවාල පාලනය කරන පිණිස හා කුඩා ආලෝකය රාත්‍රිය පාලනය කිරීම පිණිසය. උන් වහන්සේ තාරකාද සෑදූ සේක. පොළොවට ආලෝකය දෙන පිණිසත්, දවාල හා රාත්‍රිය පාලනය කරන පිණිසත් අන්ධකාරයෙන් ආලෝකය වෙන් කිරීම පිණිසත් දෙවියන්වහන්සේ ඒවා අහසෙහි තැබූහ. එය යහපත් බව දෙවියන් වහන්සේ දුටුසේක. සවස විය, උදය විය. එය සිව්වන දවසය.

ජලයේ හැසිරෙන ජීවමාන සත්වයන් බොහෝ හටගත්වා; පොළොවට ඉහළින් අහස් ගැබේ පක්ෂීන් පියාසර කරත්වා කියා දෙවියන් වහන්සේ කීසේක. තවද විශාල ජලචර සත්වයන් ද ඒ ඒ වර්ගයේ ජලයෙහි බොහෝ හටගන්නා වූ පණ ඇති සියලු සත්වයන් ද, ඒ ඒ වර්ගයේ පියාපත් ඇති සියලු පක්ෂීන් ද මැවූසේක. දෙවියන් වහන්සේ එවුන්ට ආශිර්වාද කර සඵලව බෝවෙමින් මුහුදු ජලය පුරා පැතිර සිටිව්, පක්ෂීන්ද පොළොවෙහි බෝවෙත්වා කියා කීසේක. සවස විය, උදය විය.



එය පස්වන දවසය. පොළොවේ ඒ ඒ වර්ගයේ සිවුපාවුන් ද, බඩ ගා යන සතුන් ද, පොළොවෙහි මෘගයන් ද යන ජීවමාන සත්වයන් හටගත්වා කියා දෙවියන්වහන්සේ කීසේක. එය එසේ විය. ඒ ඒ වර්ගයේ පොළොවේ මෘගයන්ද, ඒ ඒ වර්ගයේ සිවුපාවුන් ද, ඒ ඒ වර්ගයේ භූමියෙහි බඩ ගා යන සියලු සතුන්ද දෙවියන්වහන්සේ සෑදූහ. එය යහපත් බව දෙවියන්වහන්සේ දුටුහ.

## දෙවියන් මිනිසා සෑදූහ

උත්පත්ති 1:26-31

තවද දෙවියන්වහන්සේ, අපගේ ස්වරූපයෙන් අපගේ සමානත්වයට මිනිසා සාදමු. ඔවුහු මුහුදේ මත්ස්‍යයන් කෙරෙහි ද, අහසේ පක්ෂීන් කෙරෙහි ද, තිරිසනුන් කෙරෙහි ද, මුළු පොළොව කෙරෙහිද, පොළොව පිට බඩගා යන සියල්ලන් කෙරෙහි ද ආණ්ඩු කරත්වයි කීසේක. දෙවියන් වහන්සේ තම ස්වරූපයට මිනිසා මැවූසේක. දෙවියන්වහන්සේගේ ස්වරූපයෙන් ඔහු මැවූසේක ; පුරුෂයාද ස්ත්‍රිය ද ලෙස ඔවුන් මැවූ සේක. දෙවියන්වහන්සේ ඔවුන්ට ආශිර්වාද කළහ. දෙවියන් වහන්සේ ඔවුන්ට: ඔබලා බෝවී වැඩිවෙමින් පොළොව පූර්ණකර එය යටත් කර ගන්න, මුහුදේ මත්ස්‍යයන්

කෙරෙහි ද අහසේ පක්ෂීන් කෙරෙහි ද පොළොව පිට හැසිරෙන සියලු සතුන් කෙරෙහි ද, අධිපතිකම් කරන්න යයි කීසේක. තවද දෙවියන්වහන්සේ, බලව: මුළු පොළෝ තලයෙහි ඇති බීජ දරන සියලු පලාද, බීජ දරන එල ඇති සියලුම වෘක්ෂයන්ද ඔබලාට දුනිමි. එය ඔබලාට ආහාර පිණිසත් පොළොවේ සියලු මෘග යන්ටත්, අහසේ සියලු පක්ෂීන්ටත් පොළොව පිට බඩගා යන පණැති සියලු සතුන්ටත් ආහාර පිණිසත් සියලු නිල් පලා දුනිමියි කීසේක. එය එසේ විය. දෙවියන්වහන්සේ තමන් සෑදූ සියල්ලම දුටුසේක. බලව, එය ඉතා යහපත්ව තිබුණේය. සවස විය, උදය විය. එය සවෙනි දවසය.



උත්පත්ති 2 : 7

**ස්වාමි වූ** දෙවියන්වහන්සේ පොළොවේ දූවිල්ලෙන් මිනිසා සාද ඔහුගේ නාස්පුඩු තුළට ජීවනයේ හුස්ම හෙළුසේක. එවිට මිනිසා ජීවමාන ප්‍රාණයක් විය.

# මතක තබාගත යුතුයි

සෑම සත්වයකුට වඩා මිනිසා වෙනස්ය. අප, වන මෘගයන් මෙන් නැත. බයිබලයේ 1 වන කොරින්ති 15 : 39 මෙම මහත් සත්‍යයය මෙසේ පවසයි: ''සෑම මාංස එකාකාර මාංස නොවේ. මිනිස් මාංසය එක් ආකාරයකය, මෘගයන්ගේ මාංසය වෙන ආකාරයකය, පක්ෂීන්ගේ මාංස තවත් ආකාරයකය, මසුන්ගේ මාංස වෙනත් ආකාරයකය.

අන් ජීවමාන සත්වයන්ට වඩා මිනිස් මාංසය වෙනස් පමණක් නොව, මිනිසා ජීවමාන ආත්මයක් ලෙස සාදන ලදි. අප ඉපදුණු පසු අප සැමවිටම කොහේ හෝ සිටිති. ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව තම ගැළවුම්කරු

මෙන් අදහන්නන්ට සදකාල ජීවනය තිබෙන අතර ක්‍රිස්තුස්වහන්සේව ප්‍රතික්ෂේප කරන්නෝ සදකාල අපායේ දැවෙති! යොහන් 5 : 28 සහ 29 මෙසේ කියයි: ''මෙය ගැන මවිත නොවන්න. සොහොන් ගෙවල්හි සිටින අයට එතුමාගේ හඬ ඇසෙන පැය පැමිණ යහපත්කම් කළ අය ජීවනයේ නැවත නැගිටීමටත්, නපුරුකම් කළ අය විනිශ්චයේ නැවත නැගිටීමටත් නැගිට එන්නෝය.

අප සියලුදෙනම ක්‍රිස්තුස්වහන්සේගේ විනිශ්චය ආසනය ඉදිරිපිට සිටිය යුතුය. හෙබ්‍රෙව් 9 : 27 මෙසේ පවසයි: ''එක්වරක් මරණයත් ඉන්පසු විනිශ්චයත් මිනිසාට නියම කර තිබේ. රෝම 14 : 10 – 12................ අපි සියල්ලෝම දෙවියන්වහන්සේගේ විනිශ්චය ආසනය ඉදිරිපිට පෙනී සිටින්නෙමුව. මක්නිසාද, මා ජීවත්ව සිටින බැවින් සියලු දණක්ම මට නමන්නේය, සෑම දිවක්ම දෙවියන්වහන්සේට ප්‍රසංසා කරන්නේය කියා ස්වාමින්වහන්සේ කියනසේකැයි ලියා තිබේ. එහෙයින් අප එක් එක් අය තම තමා ගැන දෙවියන්වහන්සේට ගණන් දෙනවා ඇත.

ඉහත පද පෙන්වනුයේ අපි මෘගයන්ට වඩා හාත්පසින්ම වෙනස් බවය. මෘගයන් මැරී පොලවට පස් වන බව සත්‍යයකි. නමුත් දේශනාකාරයා 3 : 21 මිනිස් ප්‍රාණයේත්, සත්ව ප්‍රාණයේත් අතර ඇති වෙනස අපට පෙන්වා දෙයි: ''ඉහළට යන මිනිස් ප්‍රාණය ගැන හෝ පොළොවට යන තිරිසනාගේ ප්‍රාණය ගැන දන්නේ කවුද? දේශනාකාරයා 12 : 7 - ''දූවිල්ල තිබුණු හැටියට පොළොවට හැරී යන්නේය. ආත්මය, එය සෑදූ දෙවියන්වහන්සේ ෙත හැරී යන්නේය.'' ආත්මය එය සෑදූ දෙවියන් වහන්සේ වෙත නැවත යන බව මෙයින් අපට පෙනේ.

## මිනිසාට ගැලවුම්කරුවකු අවශ්‍යයි

රෝම 3 : 23 — ''මක්නිසාද සියල්ලෝම පව්කර දෙවියන්වහන්සේගේ මහිමයෙන් හීනවී සිටිති.

රෝම 5 : 12 — ''එහෙයින් එක් මනුෂ්‍යයෙකු නිසා පාපයත්, පාපය නිසා මරණයත් ලෝකයට ඇතුල් වූ සේම, සියළු මනුෂ්‍යයන් පව් කළ බැවින් සියල්ලන් කෙරෙහි මරණයද පැමිණුනේය.

යොහන් 3 : 5 — ''යමෙක් වතුරෙන්ද, ආත්මයෙන්ද, නූපන්නොත් ඔහුට දෙවියන්වහන්සේගේ රාජ්‍යයට ඇතුල්වීමට බැරිය.''

## දෙවියන්වහන්සේ ගැළවුම්කරුවෙකු සපයති

රෝම 5 : 6 - 11 ''මක්නිසාද අප දුර්වලව සිටියදීම නියම කාලයේදී ක්‍රිස්තුස්වහන්සේ අභක්තිකයන් උදෙසා මැරුණාහ. ධර්මිෂ්ඨයෙකු උදෙසා යමෙකු මැරෙන්ට කැමතිවීම දුර්ලභය. සමහරවිට සත්පුරුෂයා උදෙසා මැරෙන්ට යමෙකු ධෛර්යය ඇතුව සිටින්ට පුළුවන. නුමුත් දෙවියන් වහන්සේ අප කෙරෙහි ඇති තමන්වහන්සේගේ ප්‍රේමය පෙන්වන්නේ අප පව්කාරයන්ව සිටියදීම අප වෙනුවට ක්‍රිස්තුස්වහන්සේ මරණය විඳීමෙන්ය. එබැවින් ඊටත් වඩා ක්‍රිස්තුස්වහන්සේගේ ලෙය තුළින් ධර්මිෂ්ඨකරනු ලැබ අපි උන්වහන්සේ තුළින් දෙවියන්වහන්සේගේ උදහසෙන් ගළවනු ලබන් නෙමුව. මක්නිසාද අපි සතුරන්ව සිටියදීම දෙවියන්වහන්සේගේ පුත්‍රයාගේ මරණය තුළින් එතුමා සමග අප සමගි කරනු ලැබුවෙමු නම්, සමගි වූණාවූ අපි ඊටත් වඩා උන්වහන්සේගේ ජීවනය තුළින් ගළවනු ලබති. එපමණක් නොව, සමගි කිරීම අපට ලබා දුන් අපගේ ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේ තුළින් දෙවියන්වහන්සේ කෙරෙහි ප්‍රීතිද වෙමු.

යොහන් 3 : 16, 17 – ''දෙවියන්වහන්සේ ස්වකීය ඒකජාතක පුත්‍රයා දෙන තරම් ලෝකයාට ප්‍රේම කළසේක. එසේ කළේ උන්වහන්සේ කෙරෙහි අදහගන්නා සැමදෙන විනාශ නොවී සදාකාල ජීවනය ලබන පිණිසය. මක්නිසාද දෙවියන්වහන්ගේ පුත්‍රයා ලෝකයාට එවූයේ ලෝකයා විනිශ්චය කිරීමට නොව, ගළවන පිණිසය.

## ගැළවීම පිණිස අප ක්‍රිස්තුස්වහන්සේව විශ්වාස කළ යුතුයි

යොහන් 3 : 18 – ''උන්වහන්සේව අදහාගන්නා විනිශ්චය කරනු නොලැබේ. අදහානොගන්නා, දෙවියන්වහන්සේගේ ඒකජාතක පුත්‍රයාගේ නාමය අදහානොගෙන සිටින බැවින් දැනටමත් විනිශ්චය කරනු ලැබ සිටියි.

ක්‍රියා 16 : 31 - ''ස්වාමිවූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේව අදහාගන්න. එවිට ඔබද, ඔබ නිවසේ සියල්ලෝද ගැළවෙන්නාහ.

යොහන් 5 : 24 - ''මාගේ වචනය අසා, මා එවූ තැනැන්වහන්සේව අදහන්නාට සදකාල ජීවනය තිබේ. ඔහු විනිශ්වයට පත් නොවී, මරණයෙන් ජීවනයට පැමිණ ඇත.

# පිළිතුරු

මෙම ''සතුට'' මතෙව් බයිබල් පාඩමේ ඇති ප්‍රශ්නවලට පිළිතුරු මෙහි ඇත. ඔබගේ පිළිතුරු නිවැරදිද යන්න මෙයින් බලාගත හැක. සෑම ප්‍රශ්නයකටම පිළිතුරු සැපයූ පසු මෙම පිටුව බලන්න.

**පිටුව 1, 2**

1. මරියා
2. ශුද්ධාත්මයාණන්
3. දූතයෙක්
4. එම්මානුවෙල්
5. දෙවියන් අප සමගයි

**පිටුව 5**

1. ඔව්
2. ඔව්
3. නැහැ
4. නැහැ
5. ඔව්
6. ඔව්
7. ඔව්

ආ. ඔවුහු ගෙට වැද, ළදරුවා ස්වකීය මව **මරියා** සමග සිටිනවා දැක, බිම වැටී **උන්වහන්සේට** නමස්කාර කර, තම කරඬු ඇර **රන්ද, කට්ටකුමංජල්ද, සුවඳලාටුද** යන පඬුරු උන්වහන්සේට පිදූහ.

**පිටුව 8**

1. ස්වර්ග
2. පළගැටියන් හා වන මීය
3. යේසුස්වහන්සේය.
4. පරවියෙකු
5. පුත්‍රයාය

**පිටුව 10**

1. හතළිහක්
2. යක්ෂයා (පරීක්ෂකයා හෝ සාතන්)
3. රොටිවලට
4. **දේව මාළිගාවේ**
5. ඔහුට

**පිටුව 12**

1. ඇන්ඩෘ
2. දැලක්
3. යොහන්
4. දැල්

**පිටුව 15**

**ස්වර්ගයෙහි** වැඩ සිටින අපගේ **පියාණෙනි** ඔබගේ නාමයට ගෞරවය වේවා, ඔබගේ රාජ්‍යය ඒවා. ඔබගේ කැමැත්ත **ස්වර්ගයෙහි** මෙන් **පොළොවෙහිද ඉෂ්ට** කරනු ලැබේවා. අපේ දවස්පතා **භෝජන** අපට අද දුන මැනව. අප **නයකාරයන්ට** අප කම කළාක් මෙන්, අපේ ණයටත් කමා කළ මැනව. අප පරීක්ෂාවට නොපමුණුවා, **නපුරෙන්** අප ගලවා ගත මැනව. මක්නිසාද, රාජ්‍යයත්, **බලයත්**, මහිමයත් සදාකාලයටම ඔබගේය. ආමෙන්.

**පිටුව 21**

1. නුවණැති
2. අනුවණ

**පිටුව 26, 27**

අ. 1. පක්ෂීහු
2. පස්, දැවී, වියළී
3. කටුගස්
4. එල

ආ. 1. වචනය, තේරුම්
2. වචනය, බාධා
3. ලෝකය, වචනය, එල
4. එල

**පිටුව 34, 35**

අ. 1. මිනී නොමරන්න
2. කාමමිථ්‍යාචාරය නොකරන්න
3. සොරකම් නොකරන්න
4. බොරු සාක්ෂි නොකියන්න
5. නුඹේ පියාට සහ මවට ගෞරවය කරන්න
6. තමාට මෙන් තම අසල්වැසියාට ප්‍රේම කරන්න

ආ. 1. ඔව්
2. ඔව්
3. නැත
4. ඔව්
5. ඇත
6. නැත

**පිටුව 38**

1. නුදුන්සේක
2. බොහෝ
3. සිරකරුවෙකුගේ
4. බරබ්බස්වය
5. කුරුසියේ ඇණගසණු

**පිටුව 39**

1. සළුවක්
2. කටුවලින්, හිසට
3. රජුට
4. කෙළ, බටදණ්ඩෙන්

**පිටුව 40**

1. සීමොන්ට (කිරීනයේ මිනිසෙක්)
2. සොරු දෙදෙනෙකි
3. දෙවියන්වහන්සේගේ පුත්‍රයා

**පිටුව 45, 46**

1. ගල, හිම
2. මළවුන්

# ඔබ කළ යුතු දෙය

පහත සඳහන් ප්‍රශ්නවලට සැබවින්ම ''ඔව්'' කියා පිළිතුරු දීමට ඔබට හැකි නම් ''ඔව්'' කියා හිස් තැන් පුරවන්න.

________1. මෙම ''සතුට'' පොත කියවන විට, දෙවියන්වහන්සේ සිතට කථා කරන බව හැඟුණද ?

________2. ස්වාමී වූ යේසුස් ක්‍රිස්තුස්වහන්සේට අයිති වී **සදාකාල ජීවනය** ලබාගැනීමට කැමැති ද?

________3. ඔබ කල සියලුම පාප හා වැරදිවලට සැබැවින්ම දුක් වෙනවද? සියලු පාප අත්හැර ඒවා නැවත නොකිරීමට ඔබ තුළ ස්ථිර කැමැත්තක් තිබෙනවද?

________4. ඔබ දුක්වන බව යාඥකර යේසු සමිඳුට කීවද?

________5. ඔබ සිත තුලට ස්වර්ගීය සාමය සතුට එන තුරු යේසු සමිඳුට යාඥ කළාද? එතුමා ඒ යාඥව අසා සියලු පාපවලට සමාව දුන් බව දන් දන්නවාද? අපේ පව් යේසුට අපි කියා දෙමු නම් අප සියලු පාප කමා කිරීමට එතුමා විශ්වාසව ධර්මිෂ්ඨව සිටින බවට අපට පොරොන්දු වී ඇත. (මෙම පොතේ 51 වන පිටුවේ ඇති, 1 යොහන්1:9 කියවන්න.)

________6. ඔබේ පුද්ගලික ගැලවුම්කරු ලෙස ක්‍රිස්තුස්වහන්සේව දැන් විශ්වාස කරනවද ?

________7. ස්වාමින්වහන්සේගේ පිහිටෙන් එතුමව අනුගමනය කර, ඔබ ජීවිතය එතුමාට ප්‍රසන්නව ගත කිරීමට උපකාර ලබාගැනීම පිණිස යේසු සමිඳුට දිනපතා යාඥ කරනවද?

________8. යේසුස්වහන්සේව ගැලවුම්කරු මෙන් පිළිගැනීමට අන්‍යයන්ට බෙහෙවින් උපකාර වෙනවද?

# ස්වාමීන් මාගේ එඬේරාය!



නොමිලයේ – විකිණීමට නොව

Read booklets online or by App
www.wmp-readonline.org